


# කැලණිය විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය ප්‍රඥප්තිය

## 2021

## අන්තර්ගතය


1. පළමු කොටස - කැලණිය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ප්‍රඥප්තිය හැඳින්වීම 3

1.1 කැලණිය විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය ප්‍රඥප්තිය හැඳින්වීම 4
1.2 කැලණිය විශ්වවිද්‍යාලයේ දැක්ම සහ මෙහෙවර 6
1.3 කැලණිය විශ්වවිද්‍යාලය හසුරුවන මඟපෙන්වීම් මූලධර්ම 7
1.4 විවෘත බව 7
1.5 සාධාරණත්වය සහ විවිධත්වය 7
1.6 ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් සහ සමාජ ආචාරධර්ම ආරක්ෂා කිරීමට කැප වීම 8
1.7 ආවරණ සීමා 8

2. දෙවන කොටස - ශාස්ත්‍රීය පරිසරය සහ ශිෂ්‍ය සහාය සේවා 9

2.1 නේවාසික පහසුකම් 10
2.2 සෞඛ්‍ය සේවය 10
2.3 ආරක්ෂාව සහ සුරක්ෂිතතාව 10
2.4 පුස්තකාල සේවය 11
2.5 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා 11
2.6 වෘත්තීය මාර්ගෝපදේශන සේවය 12
2.7 ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ වැඩසටහන 12
2.8 ක්‍රීඩා සහ විශ්‍රාන්ති පහසුකම් 13
2.9 බහු සංස්කෘතික මධ්‍යස්ථාන 13
2.10 ශිෂ්‍ය උපකාරක සේවා සහ සුභසාධක සේවා ජාලය 14
2.11 තාක්ෂණ හා නවෝත්පාදන උපකාරක සේවය 14

3. තෙවන කොටස - පරිපාලනය සහ කළමනාකරණය 15

3.1 ශිෂ්‍යභාවය ඉල්ලා අස්කර ගැනීමේ ප්‍රතිපත්තිය 16
3.2 අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස 16
3.3 ශිෂ්‍ය නියෝජන 16
3.4 ශිෂ්‍ය සංගම් පිහිටුවීමේ අයිතිය 17
3.5 පෞද්ගලික හැසිරීම 17
3.6 විනය පවත්වාගෙන යාම සහ නීතිය හා සාමය ආරක්ෂා කිරීම 17

4. සිවුවන කොටස - තහනම් කොට ඇති සදාචාරවිරෝධී සහ නීතිවිරෝධී ක්‍රියා 18

4.1 ශාස්ත්‍රීය වංකභාවය සහ වංචාව 19
4.2 වංක හැසිරීම විසම්මුතිය සහ විරෝධය 20
4.3 අනනුකූල භාවය සහ අගෞරවය 20
4.4 භාණ්ඩ සේවා සහ තොරතුරු අවභාවිතය 21

4.5 අනවසර අරමුදල් රැස් කිරීම් 22
4.6 රැස්වීම 22
4.7 විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ මත්පැන්, මත්ද්‍රව්‍ය, දුම්කොළ භාවිතය හෝ ළඟ තබා ගැනීම 22
4.8 සූදු ක්‍රීඩාව 23
4.9 හිංසනය/ ප්‍රචණ්ඩත්වය 23
4.10 පිරිස් එකතු කිරිම/ නවක වදය 23
4.11 ලිංගික හිංසනය සහ විෂමාචාරය 25
4.12 සොරකම 26
4.13 හිතාමතා හෝ ද්වේශ සහගතව දේපළ විනාශ කිරිම 26
4.15 බලධාරින්ට සහ පර්යේෂණ කමිටුවලට සහාය දීම 27
4.16 අභියාචනා අයිතිය 27

5. පස්වන කොටස - විශ්වවිද්‍යාලයේ සහ විද්‍යාර්ථීන්ගේ අපේක්ෂා සහ වගකීම් 28

5.1 වගුව 1 - ගරු කිරීම හා මැදිහත් වීම 29
5.2 වගුව 2 - ඉගෙනීම සහ ඉගැන්වීම 30
5.3 වගුව 3 - විශ්වවිද්‍යාල සම්පත් හා පහසුකම් 32

6. අර්ථ දැක්වීම් 33

# පළමු කොටස 1

## කැලණිය විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය ප්‍රඥප්තිය හැඳින්වීම

# 1.1 ශිෂ්‍ය ප්‍රඥප්තියෙහි අරමුණ

කැලණිය විශ්වවිද්‍යාලයේ දී උපාධියක් හදාරන විද්‍යාර්ථියකුහට විශ්වවිද්‍යාලයීය ප්‍රජාවෙහි සෙසු සාමාජිකයන් සමඟ කටයුතු කිරීමේ අවස්ථා පවතී. පොදු සමාජයෙහි විශ්වවිද්‍යාලයීය ප්‍රතිරූපය සහ කීර්තිය තීරණය වන්නේ විශ්වවිද්‍යාලයීය විද්‍යාර්ථීන්ගේ සහ කාර්ය මණ්ඩලයේ චර්යාව අනුව ය. එබැවින් විශ්වවිද්‍යාලයීය ප්‍රතිරූපය සහ එහි ප්‍රජාව කෙරේ බලපෑමක් ඇති විය හැකි කර්තව්‍යයන්හි වගකීම් පිළිබඳ විද්‍යාර්ථීහු අවබෝධයෙන් සිටිය යුත්තා හ. විශ්වවිද්‍යාලයීය මෙහෙවර සාක්ෂාත් කරගනු පිණිස සහයෝගයෙන් කටයුතු කිරීමේ දී විද්‍යාර්ථීන්ගේ සහ කාර්ය මණ්ඩලයේ අන්‍යෝන්‍ය අභිමතාර්ථ මෙන් ම විශ්වවිද්‍යාලයීය අභිලාෂයන් ද ශිෂ්‍ය ප්‍රඥප්තියෙන් විග්‍රහ කෙරේ. විශ්වවිද්‍යාලයීය මෙහෙවර සාක්ෂාත් කරගත හැකි වන්නේ සාධාරණ ශිෂ්‍ය නියෝජනයක් සමඟ විශ්වවිද්‍යාලයීය ප්‍රජාවෙහි සියලු සාමාජිකයන්ගේ ගෞරවාන්විත අන්‍යෝන්‍ය ක්‍රියා සහ විශ්වවිද්‍යාලයීය දිවියෙහි මෙන් ම ප්‍රජාවෙහි ද ලා ක්‍රියාකාරී ශිෂ්‍ය සහභාගීත්වයකින් පමණි.

ශිෂ්‍ය අත්දැකීම් සහ අපේක්ෂාවන්හි පවතින විවිධතා කැලණිය විශ්වවිද්‍යාලය හඳුනාගන්නා අතර, ශාස්ත්‍රීය අතින් මෙන් ම පෞද්ගලික අතින් ද සාධාරණ සහ විනිවිද ආකාරයෙන් විද්‍යාර්ථීන් සම්බන්ධවෙන් කටයුතු කිරීමට කැප වී සිටී. සියලු විද්‍යාර්ථීන් ශිෂ්‍ය ප්‍රඥප්තියට අනුගත වීම ද ඒ සමඟ අපේක්ෂා කෙරේ.

නිරන්තරයෙන් ඉහළ යන රටේ මානව සම්පත් අවශ්‍යතාව සපුරාලිය හැකි දැනුම සහ බුද්ධියෙන් සපිරි තරුණ ප්‍රථම උපාධිධාරීන් සහ පශ්චාත් උපාධිධාරීන් නිර්මාණය කරන අතර ම උසස් අධ්‍යාපනය කෙරේ යොමු වන්-වන්ගේ අපේක්ෂා සපුරාලීමේ ද්විත්ව කාර්ය භාරය ඉටු කිරීමට කැලණිය විශ්වවිද්‍යාලය කැප වී සිටී.

තරුණ විද්‍යාර්ථීන්ට ස්වකීය උපරිම විභව්‍යතාව සහ අපේක්ෂා සාක්ෂාත් කරගත හැකි අසීමාන්තික අවස්ථා ලබාදෙමින් සීමාරහිත ලෝකය ගවේෂණය කළ හැකි සමර්පණ සහ තාක්ෂණික කුසලතා රැසකින් යුක්ත ව ඉහළ තත්ත්වයේ, අදාළ බවින් යුතු, මනා පිළිගැනීමක් සහිත, විෂය ක්ෂේත්‍ර ගණනාවකට අයත් ශාස්ත්‍රීය සහ/-හෝ වෘත්තීය කුසලතා සැලසුම් කිරීමෙන් මෙන් ම ප්‍රදානය කිරීමෙන් කැලණිය විශ්වවිද්‍යාලය  මේ ශ්‍රේෂ්ඨ කාර්යයට දායක වේ.

# 1.2 කැලණිය විශ්වවිද්‍යාලයේ දැක්ම සහ මෙහෙවර

## විශ්වවිද්‍යාලයේ දැක්ම

*තිරසාර සංවර්ධනය සඳහා දැනුම නිර්මාණය කිරීම හා බෙදා හැරීමෙහි විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් බවට පත්වීම.*

## විශ්වවිද්‍යාලයේ මෙහෙවර

*ජාතික සංවර්ධනයට දායක වන නිර්මාණශීලීත්වය හා නව්‍යකරණයන් තුළින් බුද්ධිමය පුරවැසියන් පෝෂණය කිරීම.*

ස්වකීය දැක්ම සහ මෙහෙවර අනුව යමින් ඉගෙනුම් සහ ඉගැන්වීම්, පර්යේෂණ සහ නවෝපාදනයෙහි විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් වෙමින්, ඒ ඔස්සේ රටේ සමාජීය සහ ආර්ථික වර්ධනයට දායක වීමට කැලණිය විශ්වවිද්‍යාලය අපේක්ෂා කරයි මෙලෙස සියලු වයස් කණ්ඩායම්වල විද්‍යාර්ථීන්ගේ, නිර්මාණකරුවන්ගේ, මධ්‍යස්ථ චින්තකයන්ගේ, මතවාදකරුවන්ගේ, සංස්කෘතික සහ සාහිත්‍ය ධීමතුන්ගේ විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් වීම විශ්වවිද්‍යාලයේ අරමුණ යි. නව දැනුමෙහි මධ්‍යස්ථාන වශයෙන් ද විශ්වවිද්‍යාලය සැලකෙන අතර නව ප්‍රවණතා, නව දැනුම, නව අදහස් සහ අගයන් හඹා යෑමට සියලු විද්‍යාර්ථීන් මෙන් ම අධ්‍යයන කාර්ය මණ්ඩලය ද දැඩි ලෙස ධෛර්යවත් කෙරේ. මේ අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා, ස්වාධීන ශාස්ත්‍රීය ඉගෙනුම, විචාර බුද්ධිය, ශාස්ත්‍රීය පරිපූර්ණත්වය සහ ආචාරධර්ම සම්මත සඳහා සහාය දක්වන ප්‍රජාවක් ස්ථාපනයටත්, ශක්තිමත් ව පවත්වාගැනීමටත් විශ්වවිද්‍යාලය කැප වී සිටී.

ඉගෙනීමෙහි සහ පර්යේෂණයෙහි සියලු අංශයන්හි විශිෂ්ටත්වය දක්වන විද්‍යාර්ථීන් සුසාධ්‍ය කිරීමේ අරමුණ සමඟ, ඉගෙනුම් ක්‍රියාවලියෙහි ක්‍රියාකාරී පාර්ශ්වකරුවන් වශයෙන් විද්‍යාර්ථීන් සම්බන්ධ වන පරිසරයක් නිර්මාණයට විශ්වවිද්‍යාලයට කටයුතු කරයි.

## 1.3 කැලණිය විශ්වවිද්‍යාලය හසුරුවන මඟපෙන්වීම් මූලධර්ම

ජාතික ප්‍රතිපත්ති මුල්පිරීම් සහ ප්‍රතිපත්ති අනුව, සියලු රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා මඟපෙන්වීම සහ කළමනාකරණය සිදු වන්නේ සභ්‍ය ධර්මතා සහ අයිතිවාසිකම් හා අනුගත වෙමින් සියලු දෙනාගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් පිළිගනිමින්, විවෘත බව, සමානාත්මතාව, විවිධත්වය යන ප්‍රතිපත්ති පදනම් ව ය. ඉගෙනුම් සහ ඉගැන්වීම්, සෞන්දර්යාත්මක සහ සංස්කෘතික අරමුණු, පර්යේෂණය සහ සංවර්ධන මෙන් ම සමාජ සහභාගිත්ව සහ බලපෑම් යන අංශයන්හි විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් වීමට කැලණිය විශ්වවිද්‍යාලය අපේක්ෂා කරයි.

- විවිධ පරිණත විද්‍යාර්ථී කණ්ඩායම් සඳහා උද්‍යෝගයෙන්, ප්‍රබෝධවත් ව සහ එකමුතු බවින් යුතු ව උසස් ඉගෙනුම් සහ නිර්මාණාත්මක කාර්යයන්හි නිරත වීමට උචිත පරිසරයක් නිර්මාණයට කැලණිය විශ්වවිද්‍යාලය අපේක්ෂා කරයි.
- සිවිල් සමාජයේ ආචාර ධර්ම පිළිබඳ ස්වකීය ප්‍රජාව අවබෝධයෙන් සිටින බවටත්, ඒවා අගය කරන බවටත් විශ්වවිද්‍යාලය සහතික වන අතර, ඒ සමඟ සිවිල් සමාජයෙන් අපේක්ෂිත සියලු ආකාරයේ සමාජ ආචාර ධර්මයන්ට අනුගත වෙමින්, සමාජීය වශයෙන් සචේතනික සහ වගකිවයුතු පුරවැසියන් වශයෙන් කටයුතු කිරීමේ වගකීම ද සමාජයෙන් ද අපේක්ෂා කෙරේ.

## 1.4 විවෘත බව

- ප්‍රවේශය, අධ්‍යයන වැඩසටහන්, ඇගයීම් ක්‍රියාවලි, බඳවාගැනීම් නිර්ණායක, බඳවාගැනීම් ක්‍රම මෙන් ම හිමිකම්, වරප්‍රසාද, අවස්ථා ද, දුක්ගැනවිලි සහන සහ විනය ක්‍රියාමාර්ග පිළිබඳ සියලු තොරතුරු සැපයීමට විශ්වවිද්‍යාලය පූර්ණ වශයෙනක් කැප වී සිටී.

## 1.5 සාධාරණත්වය සහ විවිධත්වය

- ශ්‍රී ලාංකීය සමාජය ජනවාර්ගිකත්වය, ආගමික විශ්වාස, ප්‍රභවය මෙන්ම සමාජ-ආර්ථික පසුබිම අතින් ද විවිධත්වයක් දක්වන බවට අවබෝධය කැලණිය විශ්වවිද්‍යාලය සතු ය.
- කිසිදු විද්‍යාර්ථියකු හෝ කාර්ය මණ්ඩල සාමාජිකයකු වයස, ජාතිය හෝ ජනවාර්ගික ප්‍රභවය, ආගම, විශ්වාසය හෝ ඇදහීම, ස්ත්‍රී-පුරුෂභාවය, ශාරීරික දුබලතා, වෛවාහක හෝ මව්පිය තත්ත්ව හෝ ලිංගික නැඹුරුව යන සාධක පදනම් ව ඍජු ව හෝ වක්‍ර ව වෙනස්කම්වලට ලක් නොවන බවට කැලණිය විශ්වවිද්‍යාලය සහතික වෙයි.

## 1.6 ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් සහ සමාජ ආචාරධර්ම ආරක්ෂා කිරීමට කැප වීම

- පුද්ගලයාගේ අයිතිවාසිකම් සහතික කරමින් ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම සහ ආචාරධර්ම (අදහස් පළ කිරීමේ අයිතිවාසිකම, සංගම් සහ අභිරුචි කණ්ඩායම් සකස් කරගැනීම, කිසි දු පීඩාවකින්, අපවාදයකින් සහ බිය ගැන්වීමකින් තොර ව කටයුතු කිරීම, පෞද්ගලිකත්ව අයිතිවාසිකම් ආදිය) පවත්වාගැනීමට ප්‍රතිපාදන සැපයීමටත් විශ්වවිද්‍යාලයෙහි සාධාරණ මෙන් ම යහපත් සමාජයක් (මත්ද්‍රව්‍ය ආදි සමාජ උවදුරුවලින් ආරක්ෂා විය හැකි, සිවිල් සමාජයේ පවත්නා ලිඛිත හෝ අලිඛිත නීති සහ ආචාරධර්ම කෙරේ අවඥා නොකරන) පවත්වා ගැනීමටත් කැලණිය විශ්වවිද්‍යාලය කැප වී සිටී.
- සියලු විද්‍යාර්ථීහු විශ්වවිද්‍යාලයීය විනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවන්හි විධිවිධානයන්ට යටත් වෙති.
- සියලු විද්‍යාර්ථීහු නිරන්තරයෙන් ම විශ්වවිද්‍යාල අත්පොතහි සඳහන් විනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා කියවීමේ, තේරුම්ගැනීමේ මෙන් ම අනුගත වීමේ ද නෛතික අයිතියට හිමිකම් කියති.
- විශ්වවිද්‍යාලයීය යහපත් නාමයට, එහි කාර්ය මණ්ඩලයට සහ සහෝදර විද්‍යාර්ථීන්ට හානි විය හැකි කටයුතුවල යෙදෙන විද්‍යාර්ථීහු උපකුලපති හෝ නියෝජ්‍ය උපකුලපති විසින් පත් කරනු ලබන විනය කමිටුව යෝග්‍ය යැයි සලකන විනය ක්‍රියාමාර්ගයන්ට ලක් වෙති.

## 1.7 ආවරණ සීමා

පීඨයට, එහි විද්‍යාර්ථීන්ට හෝ කාර්ය මණ්ඩලයට අදාළ වන හෝ බලපාන සියලු කාර්ය සහ ක්‍රියාකාරම් සම්බන්ධයෙන් ඉගෙනුම් ක්‍රමයෙහි හෝ ඉගෙනුම් ස්ථානයෙහි අදාළ බවකින් තොර ව, ශිෂ්‍ය ප්‍රඥප්තිය විශ්වවිද්‍යාලයේ සියලු විද්‍යාර්ථීන් කෙරේ බලපැවැත්වේ. එය විශ්වවිද්‍යාලයේ ව්‍යවස්ථා, නීති සහ තීරණ සමඟ කියවිය යුතු වේ.

# දෙවන කොටස

## ශාස්ත්‍රීය පරිසරය සහ ශිෂ්‍ය සහාය සේවා

# 2

විද්‍යාර්ථීන්ගේ සහ කාර්ය මණ්ඩලයේ උපරිම විභව්‍යතාව සාක්ෂාත් කරගත හැකි සහෝපකාරී ශාස්ත්‍රීය පරිසරයක් කැලණිය විශ්වවිද්‍යාලය සපයයි. සම්මත පහසුකම් කාණ්ඩයක්, ශිෂ්‍ය සේවා සහ පොදු පහසුකම් සපයනු ලැබේ විද්‍යාර්ථීන්හට ඉංග්‍රීසි භාෂා කුසලතා, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ කුසලතා, අන්තර්පුද්ගල කුසලතා▫ ව්‍යවසායකත්ව කුසලතා, නායකත්ව කුසලතා,  ආචාර සමාචාර  යනාදි අනුපූරක සහ සමර්පණ කුසලතා රාශියක් ලබාගැනීම සහාය වීම සඳහා අනුපූරක ඉගෙනුම් මධ්‍යස්ථාන සහ වැඩසටහන් විශ්වවිද්‍යාල සතු ව පවතී ස්වකීය උපරිම විභව්‍යතාව සාක්ෂාත් කොටගෙන ගෝලීය පුරවැසියන් බවට පත් වීම සඳහා විශ්වවිද්‍යාලය උපරිම දායකත්වය දක්වයි.

මේ සඳහා ස්වකීය සම්පත් සහ ඉගෙනුම්-පර්යේෂණ කටයුතුවලින් ඉහළ ම භාගය වෙන් කොට තිබේ. සපයනු ලැබ ඇති සම්පත් අනාගතය සඳහා ආරක්ෂා කරමින් ඒවායෙහි උපරිම ප්‍රයෝජනය ලැබීමට විද්‍යාර්ථීහු කටයුතු කළ යුත්තා හ. බොහෝ සම්පත් සීමිත වන අතර ඒවා බෙදාහැරීම උපරිම සාධාරණ සහ නිවැරදි අයුරින් සිදු කෙරේ.

## 2.1 නේවාසික පහසුකම්

■ විද්‍යාර්ථීන් සීමිත පිරිසක් සඳහා, සුළු ගාස්තුවක් පදනම් ව නේවාසික පහසුකම් පිරිනමනු ලැබේ. විශ්වවිද්‍යාල පරිශ්‍රයේ මෙන් ම ඉන් පිටත ද නේවාසික පහසුකම් පවතී. ආපණ ශාලා පහසුකම් සහ ඇතැම් අවස්ථාවන්හි දී ආහාර සකස් කරගැනීම සඳහා පහසුකම් ද මෙහි පවතී.

■ අධ්‍යයන ශාලාධිපති වශයෙන් කටයුතු කරන අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු මෙන් ම පූර්ණ-කාලීන උපශාලාධිපතිවරයකු ද විද්‍යාර්ථීන්ගේ යහපත උදෙසා නේවාසිකාගාර සමඟ සම්බන්ධ ව සිටී.

■ අධ්‍යයන වර්ෂයක් ආරම්භයේ දී, අධ්‍යයන ශාලාධිපතිගේ සහ පූර්ණ-කාලීන උපශාලාධිපතිගේ මෙහෙයවීමෙන් නේවාසිකාගාර කමිටුව රැස් වේ නේවාසික විද්‍යාර්ථීන්ගේ සුභසාධන ඉල්ලීම් වාර්තා කිරීම සහ ශාලාධිපති වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම කමිටුවේ සභාපතිගේ වගකීම් වේ.

මතු සැබැඳියේ දැක්වෙන නීති සහ රෙගුලාසීනට දැඩි සේ අනුගත වීමට නේවාසික විද්‍යාර්ථීන්හට උපදෙස් දෙනු ලැබේ.

https://administration.kln.ac.lk/stdwelfare/

## 2.2 සෞඛ්‍ය සේවය

■ නිතිපතා සෞඛ්‍යාරක්ෂණ සේවා සහ හදිසි සේවා සැපයීමට විශ්වවිද්‍යාලය සතු ව අභ්‍යන්තර සෞඛ්‍ය සේවා මධ්‍යස්ථානයක් පවතී ලියාපදිංචි වූ විද්‍යාර්ථීන්ට සහ කාර්ය මණ්ඩලයට නොමිලයේ වෛද්‍ය උපදෙස්, නොමිලයේ මූලික ඖෂධ, පර්යේෂණාගාර සේවා සහ අනෙකුත් සේවා හිමි වේ.

■ විශේෂ සෞඛ්‍යාරක්ෂාව හෝ හදිසි සෞඛ්‍යාරක්ෂාව අවශ්‍ය වූ විටෙක, එවැනි විද්‍යාර්ථීහු රාගම උතුරු කොළඹ ශික්ෂණ රෝහල වෙත යොමු කෙරෙති.

## 2.3 ආරක්ෂාව සහ සුරක්ෂිතතාව

■ විශ්වවිද්‍යාලයීය ආරක්ෂක සේවය විද්‍යාර්ථීන් සඳහා ආරක්ෂිත පරිසරයක් තහවුරු කරයි. විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය, විද්‍යාර්ථීන් මෙන් ම දේපොළ ද සඳහා ද ආරක්ෂාව සහ සුරක්ෂිතතාව පවත්වාගැනීමේ කාර්යය මාශල්වරුන්ට සහ ආරක්ෂක නිලධාරීන්ට පැවරී තිබේ.

■ විශ්වවිද්‍යාලයීය පරිශ්‍රයෙහි ආරක්ෂාව සහ සුරක්ෂිතතාව පවත්වාගැනීමට නියම කොට ඇති විධිනියමයන්ට සමස්ත විශ්වවිද්‍යාලයීය ප්‍රජාව අනුගත විය යුතු ය.

■ ස්වකීය රාජකාරියෙහි නිරත වන ආරක්ෂක නිලධාරියකුගේ බලයට විශ්වවිද්‍යාලයීය ප්‍රජාවෙහි කිසිවකු කිසි විටෙක බාධා නොකළ යුතු ය.

■ විශ්වවිද්‍යාලයීය පරිශ්‍රයයේ දී අනුබද්ධ ස්ථානයක දී ආරක්ෂක නිලධාරියකු ඉල්ලා සිටියහොත් ස්වකීය අනන්‍යතාවට අදාළ ලේඛන සැම අයකු ම ඉදිරිපත් කළ යුතු ය.

## 2.4 පුස්තකාල සේවය

- විශ්වවිද්‍යාලය සතු ව අංග සම්පූර්ණ පුස්තකාලයක් පවතින අතර එහි ශාඛා ඇතැම් පීඨයන්හි ද පිහිටා තිබේ.
- විෂයක්ෂේත්‍ර රැසකට අයත් මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික කෘති විශාල එකතුවකින් විශ්වවිද්‍යාලයීය පුස්තකාල සමන්විත වේ.
- පරිශීලකයන්හට මඟ පෙන්වීමට මෙන් ම සහාය දැක්වීමට ද පුස්තකාල කාර්ය මණ්ඩලය නිරන්තරයෙන් සූදානම් ව සිටී.
- සෙසු පරිශීලකයන්ගේ කටයුතුවලට බාධා නොවන පරිදි පුස්තකාලය භාවිත කිරීම සියලු පරිශීලකයන්ගෙන් අපේක්ෂා කෙරේ.
- පුස්තකාලයට අයත් මුද්‍රිත කෘති, සඟරා සහ සෙසු දෑ ඉදිරි කාලීන පරිශීලකයන්හට ද භාවිත කළ හැකි වන පරිදි පරෙස්සමෙන් භාවිත කිරීමට පරිශීලකයන්ගේ කටයුතු කළ යුතු ය.

## 2.5 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා

විශ්වවිද්‍යාලයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය මගින් විශ්වවිද්‍යාලයීය විද්‍යුත් තැපෑල, ඉගෙනුම් කළමනාකරණ පද්ධති, වයිෆයි ප්‍රවේශය, මාර්ගගත සහයෝගීතාව ඇතුළු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවාවන් කළමනාකරණය කරයි. ඊට අමතරව විශ්වවිද්‍යාල පරිගණක ජාලය, විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවි ආදිය ද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය විසින් කළමනාකරණය කරනු ලැබේ ප්‍රධාන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානයට අමතරව බොහෝ පීඨ / අධ්‍යයන අංශ පදනම් කරගත් පරිගණක විද්‍යාගාර / ඒකක ද ඇත.

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය මගින් අභ්‍යන්තර හා බාහිර සිසුන් සඳහා සහතික පත්‍ර පාඨමාලා ඉදිරිපත් කරනු ලබන අතර අධ්‍යයන කාර්ය මණ්ඩලයට සහ සිසුන්ට විද්‍යුත් ඉගෙනීම හෝ වෙබ්-පාදක ඉගෙනීම / ඉගෙනුම් කළමනාකරණ පද්ධති (LMS) / පරිගණක සහායිත ඉගෙනීම (CAL) වැනි ඉගෙනුම් සම්පත් සහ සේවාවන් ලබා දෙයි.
- විශ්වවිද්‍යාලයේ සියලුම සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ පුද්ගලික පරිගණක සඳහා Windows සහ Office 365 වැනි මෘදුකාංගවල බලපත්‍රලත් අනුවාදයන් බාගත කර ස්ථාපනය කිරීමට ඉඩ සලසා ඇත.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය විසින් සියලුම පීඨ, අධ්‍යයන අංශ, මධ්‍යස්ථාන සහ ඒකකවල සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට ප්‍රාදේශීය සම්බන්ධතා ජාලයක් (LAN) සමග අන්තර්ජාල සේවා සපයනු ලබන අතර පීඨ මගින් සපයනු ලබන අධ්‍යයන වැඩසටහන් සඳහා තොරතුරු තාක්ෂණ අධ්‍යාපන හා තාක්ෂණික සම්පත් මධ්‍යස්ථාන ලෙස ද ක්‍රියා කරනු ලබයි.

## 2.6 වෘත්තීය මාර්ගෝපදේශන සේවය

විශ්වවිද්‍යාලයේ මනා ලෙස ස්ථාපිත වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයක් ඇති අතර එය අර්ධකාලීන වෘත්තීය මාර්ගෝපදේශන අධ්‍යක්ෂකවරයකු සහ සෑම පීඨයක්ම නියෝජනය කරන්නා වූ උපදේශකවරුන්ගෙන් සමන්විත වේ.

■ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය මගින් පුළුල් පරාසයකින් යුත් ඉගෙනුම් වැඩසටහන් සහ වැඩ ලෝකයට සූදානම් වීම සඳහා අවස්ථාවන් සිසුන් වෙත ලබා දෙයි. මෙම වැඩසටහන්වල අරමුණ වනුයේ යෞවනයෙකු පාසලේ සිට විශ්වවිද්‍යාලය වෙත ප්‍රවිශ්ඨ වීම දක්වා වන සංක්‍රාන්තිය පහසු කිරීම, අධ්‍යාපනික හා වෘත්තීය උපදේශන සේවා සැපයීම, රැකියා නියුක්තිය සඳහා අවශ්‍ය කුසලතා සහ ව්‍යවසායකත්ව කුසලතා ලබා ගැනීමට ඉගෙනුම් අවස්ථා සැලසීම, පෞරුෂ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, වෘත්තීන් සම්බන්ධ තොරතුරු සැපයීම සහ උපාධි අපේක්ෂකයින්ට / උපාධිධාරීන්ට රැකියා පුහුණු අවස්ථා ලබා දීම මඟින් ඔවුන්ට රජයේ සහ පෞද්ගලික අංශයේ රැකියා සොයා ගැනීමේ දී හෝ ස්වයං රැකියා ව්‍යාපාර ආරම්භ කිරීමේදී ප්‍රයෝජනවත් විය හැකි සේවා පළපුරුද්ද ලබා ගැනීමට ඉඩ සැලසීමයි. තම අනාගත වෘත්තීන් සැලසුම් කිරීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශන සේවා භාවිත කිරීමට සිසුන් දිරිමත් කරනු ලැබේ.

## 2.7 ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ වැඩසටහන

තරඟකාරී ලෝකය තුළ සාර්ථක වීමට නම් ජාතික භාෂා නිපුණතාවයට අමතරව ඉංග්‍රීසි සහ වෙනත් විදේශීය භාෂා නිපුණතාවය ලබා ගැනීම ද අතිශයින්ම වැදගත් වේ.

■ විශ්වවිද්‍යාලය මගින් ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යයන අංශය (DELT) සහ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ වැඩසටහන් පුළුල් කර ශක්තිමත් කරනු වස්, ඊට අදාළ විෂයමාලාව භෞතික හා මානව සම්පත් මෙන්ම අධ්‍යයන අංශයේ ධාරිතා ද වැඩි දියුණු කර ඇත.

■ බොහෝ අධ්‍යයන පාඨමාලාවන්හි විෂය මාලාවට ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම ඇතුළත් කර ඇති අතර උපාධිය ලැබීමට පෙර, නියමිත සියලුම පාඨමාලා සම්පූර්ණ කිරීම සහ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සතුටුදායක නිපුණතාවයක් පෙන්වීම අනිවාර්ය කර ඇත.

## 2.8 ක්‍රීඩා සහ විශ්‍රාන්ති පහසුකම්

නිරෝගී මනසක් සහ ජවසම්පන්න සිරුරක් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් විශ්වවිද්‍යාලය විසින් අංගසම්පූර්ණ ක්‍රීඩා සහ විශ්‍රාන්ති පහසුකම් සංවර්ධනය කර ක්‍රියාත්මක කර ඇත.

- අංගසම්පූර්ණ ගෘහස්ථ ක්‍රීඩාගාරයක් කැලණිය විශ්වවිද්‍යාලය සතු ය.
- විශ්වවිද්‍යාලය මගින් ක්‍රීඩා සම්බන්ධව උපාධි පාඨමාලා ආරම්භ කර ඇති අතර ක්‍රීඩා විද්‍යාව සම්බන්ධව ද එසේ ආරම්භ කිරීමට අපේක්ෂා කරයි.
- ක්‍රීඩා සහ විශ්‍රාන්ති ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැපයීමට අමතරව, විශ්වවිද්‍යාලය මගින් බොහෝ තරඟකාරී ක්‍රීඩා සඳහා වෘත්තීය මට්ටමේ පුහුණු කිරීම් සහ මග පෙන්වීම් සපයන අතර ජාතික, අන්තර් විශ්වවිද්‍යාලයීය හා පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා සඳහා විද්‍යාර්ථීන්ගේ සහභාගීත්වය ප්‍රවර්ධනය කරයි.

## 2.9 බහු සංස්කෘතික මධ්‍යස්ථාන

ශ්‍රී ලාංකික සමාජයේ බහු වාර්ගික ස්වභාවයට අනුගත වෙමින් කැලණිය විශ්වවිද්‍යාලය සියලු සාමාජික, සංස්කෘතික, ජනවාර්ගික හා ආගමික පසුබිම්වල සිසුන්ට විවෘතව පවතී.
විද්‍යාර්ථීන්ගේ විශ්වවිද්‍යාල ජීවිතය පහසු කිරීමට සහ විශ්වවිද්‍යාලයේ සිටිය දී විවිධත්වයට ගරු කළ යුතු ආකාරය ඉගෙනීමට විවිධ මධ්‍යස්ථාන හා සංගම් මගින් විවිධ ක්‍රියාකාරකම් සංවිධානය කර ඇත.

- කලා මණ්ඩලය, උරුම අධ්‍යයන කේන්ද්‍රය සහ අනෙකුත් ශිෂ්‍ය සංගම් විසින් සංවිධානය කරනු ලබන උත්සවාංග තුළින් විවිධ සාමාජික, සංස්කෘතික, ජනවාර්ගික හා ආගමික පසුබිම්වලින් පැමිණෙන සිසුන් අතර සහජීවනය හා සමගිය ප්‍රවර්ධනය කෙරේ.
- විද්‍යාර්ථීන් විශ්වවිද්‍යාලයේ ගත කරන ජීවිතය සැප පහසුවෙන් ගත කිරීමට අවස්ථාව සලසනවාට අමතරව, ලබාගත් අත්දැකීම් මගින් ඔවුන් සමාජ විපර්යාස නියෝජිතයන් බවට පරිවර්තනය වී මුළු මහත් සමාජයෙහි ම සාමාජික හා ජනවාර්ගික සමගිය ව්‍යාප්ත කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.
- මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා විශ්වවිද්‍යාලය උත්ප්‍රේරක මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කරනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, විවිධ ජනවාර්ගික හා සමාජ කණ්ඩායම් අතර ජනවාර්ගික සහ සාමාජික සහජීවනය හා සමගිය තහවුරු කිරීමේ ඉලක්කය සපුරා ගැනීම සඳහා පුළුල් පරාසයක ක්‍රියාකාරකම් සැලසුම් කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා බහු සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීමට කැලණිය විශ්වවිද්‍යාලය දැනටමත් කටයුතු කර තිබේ.
- මෙම වැඩසටහන් තුළින් සිසුන් විවිධත්වයට ගරු කිරීමටත් එකිනෙකා කෙරෙහි අන්‍යෝන්‍ය ගෞරවය වර්ධනය කර ගැනීමටත් උගත යුතුය.

## 2.10 ශිෂ්‍ය උපකාරක සේවා සහ සුභසාධක සේවා ජාලය

■ සිසුන් ඇතුළත් කර ගැනීම, නේවාසිකාගාර පහසුකම් සැපයීම, සහ අනෙකුත් අත්‍යවශ්‍ය සේවාවන් සැපයීම සම්බන්ධ සියලු කටයුතු සඳහා වෙනම ශිෂ්‍ය සුභසාධන අංශයක් විශ්වවිද්‍යාලය තුළ පිහිටුවා ඇත.

■ ප්‍රධාන ශිෂ්‍ය උපදේශකවරයෙකු හරහා විශ්වවිද්‍යාලය තුළ ශක්තිමත් ශිෂ්‍ය උපදේශන සේවාවක් ස්ථාපිත කර ඇත. ශිෂ්‍ය උපකාරක සේවය සහ අන්‍යෝන්‍ය සබඳතා පද්ධතිය ක්‍රියාත්මක වනුයේ ශිෂ්‍ය අසහනය වළක්වා ගැනීම සහ උපදේශනය අරමුණු කරගත් කළණ මිතුරු සෙවණ මගින් වන අතර එය අධ්‍යක්ෂකවරයෙකුගේ ප්‍රධානත්වයෙන් හා සෑම පීඨයක්ම නියෝජනය කරන්නා වූ සහාය උපදේශකවරුන් මගින් ක්‍රියාත්මක කෙරේ.

■ සිසුන් සඳහා විශ්වවිද්‍යාල පරිසරය ස්වයං පරිපූර්ණ කිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් ආපනශාලා පහසුකම්, සිල්ලර වෙළඳසැල්, පොත් සාප්පු, සැලූන්, තැපැල් කාර්යාල සේවා, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් සහිත බැංකු පහසුකම් යනාදිය සපයනු ලැබේ.

■ නිර්මාණාත්මක හා විශ්‍රාන්තිමය ක්‍රියාකාරකම් සඳහා පුළුල් අවස්ථාවන් ලබා දීම සඳහා විශ්වවිද්‍යාලය විසින් සංස්කෘතික මධ්‍යස්ථාන, පාරිසරික අධ්‍යයන සංගම්, නාට්‍ය සංගම්, විෂය සංගම් වැනි පුළුල් පරාසයකින් යුත් සංගම් පිහිටුවා ඇත. එවැනි විෂය බාහිර ක්‍රියාකාරකම් හා වැඩසටහන් තුළින් සිසුන් අතර, සිසුන් හා කාර්ය මණ්ඩලය අතර සහ විවිධ ජනවාර්ගික ප්‍රජාවන් අතර සහජීවනය හා සමගිය ප්‍රවර්ධනය කෙරේ.

■ ඒ හැරුණු විට, ශාස්ත්‍රීය කටයුතුවල දී අතිශය වැදගත් වන සෞන්දර්යාත්මක වශයෙන් සුපෝෂණීය පරිසරයක් නිර්මාණය කිරීමට විශ්වවිද්‍යාලය සෑම උත්සාහයක්ම දරනු ලැබේ.

## 2.11 තාක්ෂණ හා නවෝත්පාදන උපකාරක සේවය

■ විශ්වවිද්‍යාල ශාස්ත්‍රඥයින් සහ උපාධි අපේක්ෂකයින් අතර නිර්මාණශීලිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා විශ්වවිද්‍යාලය මගින් තාක්ෂණ හා නවෝත්පාදන උපකාරක මධ්‍යස්ථානයක් (TISC) පිහිටුවා ඇත. මෙම මධ්‍යස්ථානය මගින් විශ්වවිද්‍යාල ප්‍රජාවගේ නවෝත්පාදනයන් දිරිගන්වනු ලබන අතර තාක්ෂණික තොරතුරු ලබා ගැනීමට පහසුකම් සැලසීම සහ තාක්ෂණික තොරතුරු ඵලදායී ලෙස උපයෝජනය සඳහා මහජනතාවට සහාය වීම තුළින් රටේ ආර්ථික වර්ධනයට ද දායක වේ.

■ විශ්වවිද්‍යාල ප්‍රජාව අතර බුද්ධිමය දේපළ අයිතිවාසිකම් හා සම්බන්ධ සියලු පැතිකඩ පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීමට තාක්ෂණ හා නවෝත්පාදන උපකාරක මධ්‍යස්ථානය පහසුකම් සපයයි. නව දැනුම නිර්මාණය කිරීම සඳහා වඩාත් සුදුසු පරිසරයක් සැකසීමට හා දිරිදීමනා වැඩි කිරීමට මෙන්ම විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සහ සිසුන් විසින් යොමු කරනු ලබන පේටන්ට් බලපත්‍ර අයදුම්පත් ගණන වැඩි කිරීමට ද එය උපකාරී වේ.

■ එමගින් විශ්වවිද්‍යාල උපාධිධාරීන් ව්‍යවසායකත්ව වෘත්තීන් සඳහා නවෝත්පාදන හැකියාවන්ගෙන් සන්නද්ධ කිරීම, ඔවුන්ගේ ව්‍යවසායකත්ව කුසලතා වැඩි දියුණු කිරීම සහ ව්‍යාපාර ආරම්භය සඳහා සහාය ලබා දීම ද සිදු කෙරේ විශ්වවිද්‍යාලයේ දී නිපදවනු ලබන සියලුම බුද්ධිමය දේපළ සහ ලබාගන්නා සියලුම පේටන්ට් බලපත්‍ර සඳහා බුද්ධිමය දේපළ අයිතිවාසිකම් විශ්වවිද්‍යාලය සතුය.

# තෙවන කොටස

## පරිපාලනය සහ කළමනාකරණය

# 3

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මගින් පවරා ඇති විධිවිධානවලට අනුව කැලණිය විශ්වවිද්‍යාලය ස්ථාපිත කොට, ව්‍යුහගත කොට පාලනය කරනු ලැබේ. අනෙකුත් සියලුම රාජ්‍ය විශ්වවිද්‍යාලවලට සමානව කැලණිය විශ්වවිද්‍යාලයට ද ස්වකීය මූලික කාර්යයන් කළමනාකරණය කිරීමට සහ ස්වකීය සේවාවන් සැලසුම් කිරීමට, සකස් කිරීමට, ක්‍රියාත්මක කිරීමට සහ සැපයීමට මෙන්ම දුක්ගැනවිලිවලට පිළියම් යෙදීමට සහ සිසුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ විනය පවත්වා ගැනීමට පූර්ණ බලය සහ අධිකාරිය පවරා ඇත. විශ්වවිද්‍යාලයීය පරිපාලනය හා කළමනාකරණය ප්‍රතිඵල කේන්ද්‍ර කරගත්තක් වන අතර එහිදී විශ්වවිද්‍යාලය විසින් පාර්ශවකරුවන්ට වගවීම සහ ප්‍රතිචාර දැක්වීම ද සිදුවේ ආයතනයේ විධි නියෝගය, දැක්ම සහ මෙහෙවර මගින් අර්ථ දක්වා ඇති මූලික කාර්යයන් ඉටු කිරීම සඳහා සම්පත් (එනම් මානව හා භෞතික සම්පත්, තාක්ෂණය සහ ප්‍රාග්ධනය) ප්‍රශස්ත ලෙස භාවිත කිරීමේ හැකියාව විශ්වවිද්‍යාලය සතුය.

කැලණිය විශ්වවිද්‍යාලය රටේ අනාගතය සෑම අංශයකින්ම හැඩගස්වනු ඇති අනාගත නායකයින් පුහුණු කිරීමේ විශිෂ්ටතා මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වන අතරම, විශ්වවිද්‍යාලයේ ආදර්ශවත් චරිත ලෙස ක්‍රියා කිරීමට සිසුන්ට අතිමහත් කාර්යභාරයක් තිබෙන බව ද විශ්වවිද්‍යාලය විසින් සපුරා අවබෝධ කොටගෙන ඇත. කෙසේ වෙතත්, අතීතයේ දී රාජ්‍ය විශ්වවිද්‍යාලවල සිසුන් අතළොස්සක් අතින් සිදු වූ විෂමාචාර ක්‍රියා හේතුවෙන් වර්තමානයේ දී විශ්වවිද්‍යාලවල සුමට ක්‍රියාකාරිත්වය තහවුරු කිරීම සඳහාත්, ජාතික විශ්වවිද්‍යාලවල ගෞරවය රැක ගැනීම සඳහාත්, කුඩා කල සිටම සිසුන් අපේක්ෂා කළ ජීවිත අරමුණු සාක්ෂාත් කර ගනිමින් ඔවුන්ගේ ආදරණීය දෙමව්පියන්ගේ අපේක්ෂාවන් ඉටු කිරීම සඳහාත් විශ්වවිද්‍යාල අතුරු ව්‍යවස්ථාවල විස්තර කර ඇති නීති රීති අනුගමනය කරන ලෙස විශ්වවිද්‍යාල සිසුන්ට තරයේ අවවාද කරනු ලැබේ.

## 3.1 ශිෂ්‍යභාවය ඉල්ලා අස්කර ගැනීමේ ප්‍රතිපත්තිය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියෝග මත විශ්වවිද්‍යාලයට ඇතුළත් වන අපේක්ෂකයින් අභ්‍යන්තර ශිෂ්‍යයන් ලෙස ලියාපදිංචි කරනු ලැබේ. ඔවුන් අධ්‍යයන කටයුතු සඳහා ලියාපදිංචි වී ඇති පීඨයේ නිසැකවම ඔවුන් අධ්‍යයන පාඨමාලා හැදෑරිය යුතුය. එක් විශ්වවිද්‍යාලයක අභ්‍යන්තර අපේක්ෂකයෙකු ලෙස ලියාපදිංචි වී අධ්‍යයන පාඨමාලාවක් හදාරන අතරතුර සිසුන්ට වෙනත් විශ්වවිද්‍යාලයක වෙනත් උපාධි පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වීමට අවසර නැත. එක් විශ්වවිද්‍යාලයකින් තවත් විශ්වවිද්‍යාලයකට මාරුවීම් සඳහා කෙරෙන ඉල්ලීම් සලකා බලනු ලබන්නේ සුවිශේෂී අවස්ථා යටතේ පමණි. ලියාපදිංචි වූ පාඨමාලාවකින් ඉල්ලා අස්වීම ධෛර්යමත් නොකෙරෙන අතර එමඟින් රාජ්‍ය සම්පත් සහ සුදුසුකම් ලත් සිසුන්ට ලබා දෙන වටිනා අවස්ථා අපතේ යැවීමක් සිදු වන අතරම එය විශ්වවිද්‍යාල අධ්‍යාපන සිහිනය සැබෑ කර ගැනීම සඳහා සුදුසුකම් ලත් තවත් සිසුවෙකු වළක්වාලීමක් ද වනු ඇත.

## 3.2 අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස

සෑම විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙකුගේම අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස තහවුරු කර ඇති එබැවින්, අධ්‍යයන කටයුතු, පරිපාලන හා සුභසාධන ගැටලු සහ දේශපාලන හා සමාජීය ගැටලු සහ තේමාවන් පිළිබඳ අදහස් දැරීමට සහ අදහස් ප්‍රකාශ කිරීමට සියලු ශිෂ්‍යයන් දිරිමත් කරනු ලැබේ. කෙසේ වෙතත්, එවැනි ප්‍රකාශන පුද්ගලයින් ඉලක්ක කරගත් වාග් ප්‍රහාර දක්වා දුර නොයා යුතු. මන්ද යත්, සෑම පුද්ගලයෙකුටම අන් අය වෙත එදිරිවාදී නොවී අදහස් දැරීමට සහ ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට අයිතියක් ඇති බැවිනි.

## 3.3 ශිෂ්‍ය නියෝජන

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතෙහි සංශෝධනයන්ට අනුකූලව තීරණ ගැනීමේ නිශ්චිත මට්ටම්වල දී ශිෂ්‍ය නියෝජනය පැවතිය යුතු බව සහතික කෙරේ. සුභසාධන කටයුතු මෙන්ම පරිපාලන හා ශාස්ත්‍රීය ස්වභාවය හා සම්බන්ධ ඇතැම් කාරණා සම්බන්ධයෙන් ශිෂ්‍ය නියෝජිතයින් හරහා අදහස් ඉදිරිපත් කිරීමට ශිෂ්‍යයන්ට අයිතිය තිබේ පීඨ මණ්ඩල රැස්වීම්, ආහාර හා ආපනශාලා කමිටු, ආරක්ෂක කමිටු, නේවාසිකාගාර කමිටු, ක්‍රීඩා කමිටු සහ විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරනු ලබන විවිධ උත්සව සඳහා වන තත් කාර්ය කමිටුවලට ද ශිෂ්‍ය නියෝජිතයින් සහභාගී විය යුතුය.

## 3.4 ශිෂ්‍ය සංගම් පිහිටුවීමේ අයිතිය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතෙහි සංශෝධනයන්ට අනුකූලව ශිෂ්‍ය සංගම් පිහිටුවීමේ අයිතිය තහවුරු කෙරේ. පෞද්ගලික හෝ දේශපාලනික අරමුණුවලින් තොර සංගම් හෝ සමාජ හෝ සමිති පිහිටුවීමට හෝ ඒවාට සම්බන්ධ වීමට සිසුන්ට අයිතිය ලබා දී ඇත. ඒ හා සමානව, ස්වාධීනව සිටීමට කැමති සහ එවැනි සංගම්වලට බැඳීමට අකමැති ශිෂ්‍යයන්ගේ අයිතිවාසිකම් ද තහවුරු කෙරේ. සංගම් හා සමිති පිහිටුවන්නා වූ ශිෂ්‍යයන් අනෙකුත් ශිෂ්‍යයන්ගේ තේරීමේ නිදහසට ගරු කළ යුතුය. ස්වාධීනව සිටීමට කැමති ශිෂ්‍යයන්ගේ නිදහසට බාධා නොකරන ලෙසට ශිෂ්‍යයන්ට අනතුරු අඟවනු ලැබේ.

## 3.5 පෞද්ගලික හැසිරීම

විශ්වවිද්‍යාල ප්‍රජාවට අයත් වන්නා වූ සෑම පුද්ගලයෙකුම ආයතනයේ කීර්තිය සහ එහි සාමාජිකයන්ගේ ආත්ම අභිමානය සම්පූර්ණයෙන් වටහා ගත යුතුය. එමනිසා, විශ්වවිද්‍යාලයේ සියලු වැසියන් එහි මෙහෙවරට අනුකූල වන පරිදි හැසිරිය යුතුය. පුද්ගලයන් ඔවුන්ගේ පෞද්ගලික සනීපාරක්ෂාව, ආචාර සමාචාර, ඇඳුම් පැළඳුම්, කතාබහ යනාදිය ගැන සැලකිලිමත් විය යුතුය. කිසිම සිසුවෙක් සෙසු සිසුන්ගේ හෝ ප්‍රජාවේ සාමාජිකයින්ගේ සිත් නොරිදවිය යුතුය. තමන් පිළිගන්නා වූ සංස්කෘතික පිළිවෙත්වලට සරිලන අයුරින් ඇඳුම් ආයිත්තම් පැළඳීමට හෝ ආහාරපාන ගැනීමට මිනිසුන්ට නිදහස ඇති බව ද මතක තබා ගත යුතුය. එනිසා කිසිවෙකුත් තමාගේ කැමැත්තට සරිලන පරිදි ඇඳුම් ආයිත්තම් පැළඳීමට හෝ ආහාරපාන ගැනීමට අන් අයට බලපෑම් නොකළ යුතුයි ශිෂ්‍යයන් ඔවුන්ගේ වචනවලින් හා ක්‍රියාවෙන් ආචාරශීලී විය යුතු අතර සියලු මිනිසුන්ට එකමුතුව ජීවත් වීමට ඉඩ දිය යුතුය. ආක්‍රමණශීලී ක්‍රියාකාරකම්වල යෙදීම පොදු අනර්ථකාරී ක්‍රියා වැළැක්වීමේ නීති රාමුව සහ විශ්වවිද්‍යාලයේ විනය රෙගුලාසි යටතේ දඬුවම් ලැබිය හැකි වරදකි.

## 3.6 විනය පවත්වාගෙන යාම සහ නීතිය හා සාමය ආරක්ෂා කිරීම

අනාගත නායකයින් පුහුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානය විශ්වවිද්‍යාලයයි.එබැවින් එහි වැසියන් සිවිල් සමාජයේ සියලු සම්මතයන්ට හා ප්‍රතිපත්තීන්ට අනුකූලව වගකිවයුතු හා ගෞරවණීය ලෙස හැසිරීම අත්‍යවශ්‍ය වේ. තවද, ඔවුන් විශ්වවිද්‍යාලය විසින් පනවන ලද සියලුම නීති රීතිවලට අනුගත විය යුතුය. සියලුම විශ්වවිද්‍යාල සිසුන් ඉහළම චර්යාත්මක හා සදාචාරාත්මක සම්මතයන් පිළිපැදිය යුතුය. ඔවුන් විශ්වවිද්‍යාලයේ කීර්තිනාමය ආරක්ෂා කරනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර විශ්වවිද්‍යාලයට අපකීර්තියක් ගෙන දෙන සහ ඔවුන්ගේ අනාගතයට වෙනස් කළ නොහැකි ලෙස හානි ගෙන දෙන කිසිදු සදාචාරවිරෝධී, දුරාචාරාත්මක හා නීතිවිරෝධී කටයුත්තක නිරත නොවිය යුතුය.

# සිවුවන කොටස

# 4

## තහනම් කොට ඇති සදාචාර විරෝධී සහ නීති විරෝධී ක්‍රියා

කැලණිය විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් විසින් විශ්වවිද්‍යාලය මගින් විනය ක්‍රියාමාර්ග ගැනීමටත් පොලිසියේ සහ අධිකරණවල දඬුවම් ලැබීමටත් හේතු වන්නා වූත් පහත සඳහන් සදාචාර විරෝධී සහ නීති විරෝධී ක්‍රියාවල නිරතවීමෙන් වැළකී සිටිය යුතුය. 1998 අංක 20 දරන අධ්‍යාපන ආයතනවල නවක වධය සහ වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා තහනම් කිරීමේ පනත මගින් එවැනි වැරදිකරුවන්ට එරෙහිව උසාවිය හරහා දඬුවම් පැමිණවීම සඳහා පොලීසියට බලය පවරා ඇති පහත ලැයිස්තුගත කර ඇති සදාචාර විරෝධී සහ නීති විරෝධී ක්‍රියාකාරකම්වල නියැලෙන්නන්ට එරෙහිව දැඩි ක්‍රියාමාර්ග ගැනීමට විශ්වවිද්‍යාල / උසස් අධ්‍යාපන ආයතනවල නවක වධ උවදුර මැඩපැවැත්වීම සඳහා දැඩි මාර්ගෝපදේශ සපයනු ලබන්නා වූ 2010 ජනවාරි 15 වන දිනැති අංක 919 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛය මගින් විශ්වවිද්‍යාල පාලනාධිකාරිය වෙත බලතල පවරා ඇත. තවද, විශ්වවිද්‍යාල දේපළවලට සිදුවන හානිය සම්බන්ධයෙන් වැරදිකරුවන් වගකිව යුතු බවටත්, වගකිවයුතු පුද්ගලයින්ගෙන් හෝ ශිෂ්‍ය සමිති හා සංගම් සඳහා වෙන් කර ඇති මුදලින් එම අලාභය පියවා ගන්නා ලෙසත්, 2008 දෙසැම්බර් 1 වන දිනැති අංක 902 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛය මගින් සියලුම විශ්වවිද්‍යාල වෙත උපදෙස් ලබා දී ඇත. එබැවින්, අධිකරණයක් විසින් පනවනු ලබන දඬුවම්වලට අමතරව විශ්වවිද්‍යාලය විසින් නියම කරනු ලබන දඬුවම, අලාභ අයකර ගැනීම සහ / හෝ අනතුරු ඇඟවීමේ ලිපියක් නිකුත් කිරීමේ සිට තාවකාලික පන්ති තහනම සහ / හෝ විශ්වවිද්‍යාල නේවාසික පහසුකම් තාවකාලිකව අත්හිටුවීම සහ විශ්වවිද්‍යාලයෙන් නෙරපා හැරීම දක්වා වූවක් විය හැකිය.

## 4.1 ශාස්ත්‍රීය වංකභාවය සහ වංචාව

- අධ්‍යයන කටයුතු සහ විභාග කටයුතුවල දී උපාධි අපේක්ෂකයින් විසින් ඉහළ ශාස්ත්‍රීය ප්‍රමිතීන් සහ ශාස්ත්‍රීය අවංකභාවය පවත්වා ගෙන යාම අවශ්‍ය වේ.
- විභාගවලදී අනවසර ලිපි ද්‍රව්‍ය ළඟ තබා ගැනීම හෝ පිටපත් කිරීම, ශිෂ්‍ය වාර්තා හෝ නිබන්ධන හෝ පැවරුම්වල ඇතුළත් වෙනත් අයගේ නිර්මාණ හා ලේඛනවල එන තොරතුරුවල මූලාශ්‍රය හෙළි නොකර පිටපත් කිරීම හෝ ප්‍රතිනිර්මාණය කිරීම තහනම් ය. එම තහනම උල්ලංඝනය කරන්නන්ට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග ගනු ලැබේ.
- ඉදිරිපත් කරන ලද ඕනෑම කෘතියක් තමන්ගේම කෘතියක් වන බවටත්, යොදා ගන්නා ලද අන් අයගේ කෘතීන් සඳහා නිසි කෘතඥතාව පළ කිරීමටත් සියලුම සිසුන්ට උපදෙස් දෙනු ලැබේ.
- ශාස්ත්‍රීය වංකභාවය පහත පරිදි වේ:

i. අන් අයකුගේ ලේඛනයක් දැනුම් දීමකින් තොරව භාවිතය. (Plagiarism)

ii. කර්තෘ අයිතිය කෙලෙසීම - අයිතිකරුගේ හිමි අවසරයකින් තොරව ප්‍රශ්නාවලි හෝ භාවිතය සීමා කර ඇති උපකරණ (tools) භාවිතය.

iii. ආචාර ධර්මානුකූල සමීක්ෂණයකින් හෝ අනුමැතියකින් තොරව (අවශ්‍ය තැන්හි දී) පර්යේෂණයෙහි නියැලීම- ආචාර ධර්ම පිළිබඳ වටහා ගැනිමකින් තොරව/හඳුනා ගැනීමකින් තොරව/හඳුනා ගැනීමකින් තොරව පර්යේෂණයෙහි නියැලීම.

iv. අධ්‍යයන කොන්දේසි (protocols) කෙලෙසීම - ආචාර්ධර්ම සමීක්ෂණ කමිටුව මඟින් හඳුන්වා දී ඇති පිළිගත් පර්යේෂණ කොන්දේසිවලට අනුගත නොවීම.

v. සම්පත් දායකයින් හඳුනා නොගැනීම - විවිධ ප්‍රකාශන හා සම්බන්ධ සම්පත් දායකයින්ගේ නම් අදාළ ලේඛනවලින් ඉවත් කිරීමට කටයුතු කිරීම.

vi. සුළු සම්පත් දායකයින් (කර්තෘන් නොවන) - පර්යේෂණය සඳහා සුළු දායකත්වයක් ලබා දුන් රචකයින්ගේ නම් ඇතුළත් කිරිම.

vii. කර්තෘන්ගේ පූර්ව අනුමැතියකින් තොරව නම් ඇතුළත් කිරිම - (පර්යේෂණ දීමනා අයදුම්පතෙහි) ඔවුන්ගේ අනුමැතිය නොමැති අවස්ථාවක රචකයකුගේ හෝ පර්යේෂණකයෙකුගේ නම ඇතුලත් කිරීම. (ආචාර ධර්ම සමීක්ෂණ අයදුම් පතෙහි හෝ ප්‍රකාශනයෙහි)

viii. අසත්‍ය තොරතුරු ප්‍රකාශනය - අසත්‍ය තොරතුරු හෝ දත්ත ගුණ කර ඇතුළත් කිරීම.

ix. පර්යේෂණ අනු පිටපත් ගැනීම - පූර්වයේ කෙරුණු ප්‍රකාශන පිළිබඳ සඳහනකින් තොරව එකම පර්යේෂණයට අදාළ ප්‍රකාශන කිහිපයක් සිදු කිරිම.

x. පර්යේෂණ දීමනා අවභාවිතය - පර්යේෂණ දීමනා කමිටුවෙහි පූර්ව අවසරයකින් තොරව, ලබා දී ඇති පර්යේෂණ දීමනා, පර්යේෂණ අරමුණින් පරිබාහිර අන්‍ය අරමුණු සඳහා භාවිතය.

■ ඉහත දැක්වූ කවර ක්‍රියාවක් හෝ සිදු කිරීම, අදාළ ඇගයීම් කාර්යයේදී නුසුදුස්සකු බවට පත් වීමට හෝ පහළ මට්ටමේ ලකුණක් හිමි වීමට මෙන්ම වගකිව යුතු සියල්ලන්ට එරෙහිව විනය ක්‍රියා මාර්ග ගැනීමට ද හේතු පාදක වනු ඇත.

■ ශාස්ත්‍රීය වංකභාවය සහ වංචනික ක්‍රියා සම්බන්ධ වැඩිදුර තොරතුරු කැලණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රීය අඛණ්ඩභාවය□ රැව්යෙහි සට්ටන සහ ආචාර ධර්‍ම සඳහා වන ප්‍රතිපත්ති ඇතුළත් ලේඛනයෙහි සඳහන්ය. (CQA/A/P03)

https://units.kln.ac.lk/qac/images/Policy_on_Academic_Intergrity.pdf

## 4.2 වංක හැසිරීම, විසම්මුතිය සහ විරෝධය

■ විද්‍යාර්ථීන් විසින් සිදු කරනු ලබන සම්මත සමාජ සදාචාරයට පටහැනි හැසිරීම් හෝ විශ්වවිද්‍යාලයීය සම්මත කෙලෙසීම අනුමත නොකෙරෙනු ඇත.

■ විශ්වවිද්‍යාලය තුළ හෝ, විශ්වවිද්‍යාලය මඟින් අනුග්‍රහය දක්වන කාර්යයක දී හෝ විශ්වවිද්‍යාලය තුළ හෝ ඉන් පිටත සිදුවන ආක්‍රමණශිලි, අසභ්‍ය ප්‍රචණ්ඩ හෝ අවිනීත හැසිරීමක් අනුමත නොකෙරේ.

■ අක්‍රමිකතාවලින් සමන්විත, සිවිල් නීතිය හෝ විශ්වවිද්‍යාලයීය නීතින් උල්ලංඝනය කෙරෙන වැඩ සටහන් යෙදෙන කාර්යයන් සංවිධානය□ අනුග්‍රහය දැක්වීම, ක්‍රියාත්මක කිරීම සපුරා තහනම් වන අතර එවැන්නක් විනයානුකූල ක්‍රියා මාර්ග ගැනීමට හේතු වේ.

## 4.3 අනනුකූල භාවය සහ අගෞරවය

විශ්වවිද්‍යාලයේ සිය කාර්යයභාරය ඉටු කරන නිලධාරින්ගේ නියෝගවලට අනනුකූල වීම තහනම්ය. පහත දැක්වෙන ක්‍රියා හෝ ඊට සමාන ක්‍රියා සඳහා විනයානුකූල පියවර ගැනිමේ හැකියාව ඇත.

**i.** අපහාසාත්මක හෝ අවිනීත භාෂා භාවිතය.

**ii.** අවිනීත හෝ නොමනා ඉංගිත භාවිතය.

**iii.** විශ්වවිද්‍යාලයීය නිලධාරීන්ට අසත්‍ය හෝ වංචනික තොරතුරු ලබා දීම විශ්වවිද්‍යාලයීය නිලධාරියකුගේ සාධාරණ ඉල්ලීමකට අනුගත වීම ප්‍රතික්ෂේප කිරීම හෝ අගෞරවාන්විත හැසිරීම් ප්‍රදර්ශනය.

**iv.** තමාට භාර කළ කාර්යයට නොපැමිණීම ද ඇතුළත්ව, නියමිත කාල සීමාවක් තුළ, සාධාරණ ඉල්ලීමකට ප්‍රතිචාර නොදැක්වීම.

**v.** වුවමනාවෙන්ම සහ දැනුවත්ව ම ඉගැන්වීමේ ක්‍රියාවලියට මැදිහත් වීම.

**vi.** යම් සිදුවීමක් පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමට බාධා කිරීම.

## 4.4 භාණ්ඩ, සේවා සහ තොරතුරු අවභාවිතය

විද්‍යාර්ථීන් විසින් විශ්වවිද්‍යාලය සම මහජනතාව සමඟ අවංකවල විශ්වසනීයව කටයුතු කළ යුතු වේ. විද්‍යාර්ථීන්ට හා ඔවුන්ගේ අමුත්තන්ට පහත කටයුතු තහනම් වේ :

- **i.** යම් පුද්ගලයකුගේ හෝ කණ්ඩායමකගේ යම් දේපලක් අනවසරයෙන් අත්පත් කර ගැනීම හෝ යම් සේවාවක් අනවසරයෙන් ලබා දීම.
- **ii.** අසත්‍ය මවා පෑම් සහිතව භාණ්ඩ, සේවා හෝ මුදල් වංචා කිරීම.
- **iii.** සොරකම් කළ හෝ වංචා කළ බව දන්නා දේපළක්, මුදලක් හෝ සේවාවක්, අත්පත් කර ගැනීම, අයිති කර ගැනීම හෝ ලබා ගැනීම.
- **iv.** ගෙවීමට ඇති මුදල් හෝ වෙනයම් කාර්යයක් සඳහා, විශ්වවිද්‍යාලය විසින් පිළි නොගන්නා බව දැනුවත්ව සිටියදීත් චෙක්පත් නිකුත් කිරීම.
- **v.** යතුරු අනුපිටපත් ගැනීම, පරිගනක ප්‍රවේශ කේත හෝ වෙනත් උපකරණය සඳහා වන කේත නිසි අවසරයකින් තොරව ලබා ගැනීම.
- **vi.** පරිපාලන වාර්තාවලට අන්තර්ගත කළ යුතු තොරතුරු වංචනික ලෙස වෙනස් කිරිම හෝ වැරදි තොරතුරු ලබා දීම හෝ පරිපාලන හෝ විනය ක්‍රියා පටිපාටයක දී එවැනි තොරතුරු ලබා දීම.
- **vii.** පරිගණක පද්ධතිය අනවසරයෙන් භාවිත කිරිම, පරිගණක ප්‍රවේශ කේත හෝ පරිගණක සේවාවේ තහනම් කලාප අනවසරයෙන් ඇසුරු කිරීම.
- **viii.** අසත්‍ය හැඳුනුම්පත් භාවිතය හෝ ළඟ තබා ගැනීම.
- **ix.** විශ්වවිද්‍යාලයෙන් අවසර ලබාදුන් පුද්ගලයන් හැර, විශ්වවිද්‍යාලයේ කාර්යයාල, අධ්‍යයන අංශවල, විද්‍යාගාර, පීඨ ගොඩනැගිලි, කාමර හෝ නැවතුම් ශාලාවලට ප්‍රවේශ වීම සඳහා වන යතුරු හෝ වෙනත් උපකරණ (අංක කේත හෝ ඇතුලත්වීමේ කාඩ්පත් වැනි) භාවිතය හෝ ළඟ තබා ගැනීම.

## 4.5 අනවසර අරමුදල් රැස් කිරීම්

■ විශ්වවිද්‍යාලයීය අරමුණක් සඳහා වන හෝ විද්‍යාර්ථීන් විසින් සංවිධානය කළ හෝ, බලධාරීන් විසින් සංවිධානය කළ ඕනෑම අරමුදල් රැස් කිරීමක්/ඉල්ලීමක් උපකුලපතිතුමා/තුමියගේ නිසි අවසරයක් සහිතව සිදුවිය යුතුය.

■ අනුග්‍රහය හෝ අරමුදල් ලබා ගැනීම සඳහා බාහිර පාර්ශ්වයක් වෙත කෙරෙන ඕනෑම ඉල්ලීමක් උපකුලපතිතුමා/තුමියගේ අනුමැතියට යටත්ව අදාල බාහිර ආයතනයකට යැවෙන ලිපියකින් සිදු කළ යුතුය.

■ එවැනි අනුමැතියකින් තොරව, දේශපාලන හෝ පුණ්‍ය කටයුත්තක් හෝ සමාජීය ක්‍රියාකාරකමක් උදෙසා මුදල් ඉල්ලා සිටීම හෝ අරමුදල් රැස් කිරීම විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ හෝ ඉන් පිටත දී සිදු කිරීමට අවසර නොලැබේ.

## 4.6 රැස්වීම

උපකුලපතිතුමාගේ/තුමියගේ අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාලය තුළ පිටස්තර පුද්ගලයකු, ආයතන, ව්‍යාපාර කටයුතු කරන්නෙකුට රැස්වීම තහනම්ය. මෙයට රැස්වීම් පැවැත්වීම, කවර ආකාරයක හෝ පත්‍රිකා බෙදා හැරීම, පළ කිරීම, භාණ්ඩ හා සේවා හුවමාරු කිරීම, විකිණීම ඇතුළත්ය.

## 4.7 විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ මත්පැන්, මත්ද්‍රව්‍ය, දුම්කොළ භාවිතය හෝ ළඟ තබා ගැනීම්

■ මිනිස් මනස විකෘතිතාවට පත් කර හැසිරීම අනනුකුල බවට හරවන බැවින් සහ මානසික සහ ශාරීරික හැකියා හීන කරවන බැවින්, ශ්‍රී ලාංකීය සමාජය, මත්පැන්, මත්ද්‍රව්‍ය සහ දුම්කොළ භාවිතය අනුමත නොකරයි. එමනිසා, රාජ්‍ය විශ්වවිද්‍යාල විසින්, එම විශ්වවිද්‍යාල පරිශ්‍ර තුළ මත්පැන් මත්ද්‍රව්‍ය සහ දුම්කොළ භාවිතය හෝ සන්තකයේ තබා ගැනීම තහනම් කිරීම සම්බන්ධව ක්‍රමවේදයක් පවත්වාගෙන යයි. එබැවින්, විශ්වවිද්‍යාලය තුළට හෝ විශ්වවිද්‍යාල පරිශ්‍රයට මත්පැන්, මත්ද්‍රව්‍ය ගෙන ඒමෙන් වැලකෙන ලෙස විද්‍යාර්ථීන්ට තරයේ අවවාද කෙරේ.

■ විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළට මත්පැන්, මත්ද්‍රව්‍ය හෝ එවැනි මත්වන ඕනෑම ද්‍රව්‍යයක් භාවිත කර ඇතුල්වීම තහනම්ය. මත්පැන්, මත්ද්‍රව්‍ය හෝ දුම්කොළ විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ ළඟ තබා ගැනීම තහනම්ය.

## 4.8 සූදු ක්‍රීඩාව

- විශ්වවිද්‍යාලය තුළ සූදු ක්‍රීඩාවේ නියැලීම තහනම්ය.
- ඕනෑම ආකාරයක ඔට්ටු ඇල්ලීම්, එවැන්නක් පිළිගැනීම, එවැනි ඔට්ටු ඇල්ලීමේ ක්‍රියා පවත්වා ගෙන යාම හෝ ගෙවීම් කිරීම තහනම්ය.
- සූදු ක්‍රීඩාවේ නියැළී හසුවන ඕනෑම විද්‍යාර්ථියකුට විශ්වවිද්‍යාල රෙගුලාසි සහ පවතින නීතිය යටතේ දඬුවම් ලැබේ.

## 4.9 හිංසනය/ ප්‍රචණ්ඩත්වය

- විශ්වවිද්‍යාලය තුළ හෝ ඉන් පිටත තනි පුද්ගලයකුට උසිගැන්වීම (incit) හෝ පුද්ගල කණ්ඩායමකට හිංසනය සිදු කිරීම හෝ ප්‍රචණ්ඩකාරී හැසිරීම් පළ කිරීම සිවිල් නීතිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදකි.
- හිංසනයට සහ ප්‍රචණ්ඩත්වයට අදාළ වන සිවිල් නීතිය විශ්වවිද්‍යාලය තුළ සහ ඉන් පිටත දී සමානව අදාළ වේ මෙයට සෘජුව හෝ වක්‍රව විශ්වවිද්‍යාලයේ පීඨ සමාජිකයින්ට, පරිපාලන නිලධාරින්ට, ශිෂ්‍යයන්ට හෝ අමුත්තන් යන අයට එරෙහිව කෙරෙන පහත ක්‍රියාකාරකම් ඇතුළත් වේ.

i. තනි පුද්ගලයකුට හෝ පුද්ගල කණ්ඩායමකට එරෙහිව තර්ජනය කිරීම සහ හෝ ශාරීරික බලය පාවිච්චි කිරිම.

ii. තනි පුද්ගලයෙකුට හෝ පුද්ගල කණ්ඩායමකට එරෙහිව ශාරීරික තුවාල හෝ මානසික කම්පනයට හේතු වන කටයුතු සිදු කිරීම හෝ දේපළ හානිය.

iii. තනි පුද්ගලයකුට හෝ පුද්ගල කණ්ඩායමකට සිදුවන බිය ගැන්වීම, හිරිහැර කිරිම් සහ හිංසනය

iv. පීඩා කිරිම සහ අන් අයගේ කෝපයට හේතුවන ක්‍රියා සිදු කිරිම.

v. දුරකථනය, ලිපි, පරිගණකය හරහා යැවෙන ඊමේල් හෝ වෙනයම් සන්නිවේදන ක්‍රමයක් මඟින් හිංසනයට ලක් කිරීම.

ඉහත කරුණු සම්බන්ධ හෝ වෙනයම් ආකාරයක හිංසනයක් ප්‍රචණ්ඩකාරී හැසිරීමක් පිළිබඳ කවර හෝ පැමිණිල්ලක් ලද හොත් එය උපකුලපති විසින් පත්කරන ලද විනය කමිටුවකට යොමු කර විනය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

## 4.10 පිරිස් එකතු කිරිම/ නවක වදය

- නවක වදය යනු 1998 දී පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද 1998 අංක 20 දරණ අධ්‍යාපන ආයතනවල නවක වදය සහ වෙනත් ආකාරයේ හිංසන තහනම් කිරිමේ නීතිය යටතේ සාපරාධී වරදකි.

■ හිංසා කිරිම හෝ පිරිස් රැස් කිරිම යන්න කායික, මානසික, චිත්තවේගීය හෝ මනෝමය වශයෙන් වෙනත් පුද්ගලයකු කැමැත්තෙන් හෝ අකමැත්තෙන් අපයෝජනයල හිරිහැර කිරීමල පහත් කොට සැලකීම, අවමන් කිරිම ලෙස අර්ථ දැක්වේ. විශ්වවිද්‍යාලය තුළ හෝ ඉන් පිටත මෙම ක්‍රියා තහනම් වන අතර ඒවාට පහත කරුණු ඇතුළත් වන අතර, මෙම ක්‍රියා මේවාට පමණක් සීමා නොවේ.

i. පහත් නින්දිත කටයුතුවල යෙදීමට හෝ එවැනි ක්‍රියා කිරීමට පුද්ගලයකුට බල කිරිම.

ii. තනි පුද්ගලයකුට හෝ පුද්ගල කණ්ඩායමකට හිරිහැර කිරීමඃ බල කිරීම හෝ බිය ගැන්වීම.

iii. දැඩි ශාරිරික හා මානසික වෙහෙසක් ඇති කිරීම.

iv. ශාරිරික සහ මානසික කම්පවනවලට හේතු සැකසීම.

v. නොගැළපෙන, කැපී පෙනෙන ඇඳුම් පැළඳුම් ඇඳීමට බල කිරිම.

vi. පහත් යැයි සැලකෙන ක්‍රියා, ක්‍රීඩා හෝ ක්‍රියාකාරකම්වල යෙදීමට පුද්ගලයකුට හෝ පුද්ගලයන්ට බල කිරීම.

vii. සිවිල් සමාජයේ සම්මතයන්ට අනුගත නොවන හෝ, අධ්‍යාපන කටයුතුවලට බාධාවන ආකාරයේ, පාන්දර යාමයේ සහ සවස් යාමයේ සිදුවන ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වීමට තනි පුද්ගලයන් හෝ පුද්ගල කණ්ඩායමකට බල කිරීම.

viii. විශ්වවිද්‍යාල ප්‍රතිපත්තිවලට අනුකූල නොවන, විශ්වවිද්‍යාලයේ දැක්මට/මෙහෙයුමට දැඩිලෙස බලාපන ආකාරයේ සිතුවම් ශරිරයේ ඇඳීම.

■ ඉහත අකාරයේ ඕනෑම සිදුවීමක් වෙතොත් අවශ්‍ය ක්‍රියාමාගී ගැනීම සඳහා (පාර්ලිමේන්තුව විසින් 1998 සම්මත කරන ලද නවක වදය විරෝධී නීතිය යටතේ) පොලීසියට බාර දෙනු ලබන අතරල විශ්වවිද්‍යාල විසින් ද නිසි විනය ක්‍රියා මාගී ගනු ලැබේ.

■ නීතිය මඟින්, වරදකරුවන්ට දඬුවම් පැමිණ වීම සඳහා පොලිසියට බලය පවරා තිබේ.

■ 2010 ජනවාරි 15 අංක 919 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව විශ්වවිද්‍යාල හෝ උසස් අධ්‍යාපන ආයතනවල නවකවදය නැවැත්වීම සඳහා දැඩි ක්‍රියා මාර්ග ගෙන ඇති අතර, එමඟින් විශ්-වවිද්‍යාල පරිපාලනයටල ආචාරධර්ම විරෝධි හෝ නීති විරෝධි ක්‍රියාවල නිරතවන ඕනෑම අයෙකුට එරෙහිවල දැඩි ක්‍රියා මාගී ගැනීම සඳහා) බලතල පවරා ඇත.

■ මෙවන් ක්‍රියාවකට සාක්ෂිකරුවෙකු වන ශිෂ්‍යයෙකු අපරාධයකට සහය දීමෙන් තොරවල විධිමත් පැමිණිල්ල-ක් මඟින් හෝ නිර්නාමිකවල එය අදාළ බලධාරින්ගේ අවධානයට අප්‍රමාදව යොමු කළ යුතුය.

■ සිසුන්ට කෙරෙන නවක වදයට එරෙහිව ක්‍රියාකාරීව කටයුතු කරන අයට එරෙහිව විද්‍යාර්ථීන් කටයුතු නොකළ යුතුය.

# 4.11 ලිංගික හිංසනය සහ විෂමාචාරය

■ ලිංගිකත්වය අරමුණු කරමින් ලිංගික වශයෙන් කෙරෙන ඕනෑම ශාරීරික, මානසික හිංසනයක් ලිංගික හිංසනය නම් වේ. මෙයට ලිංගික හිංසනය, පහරදීම්, දූෂණය කිරීම් සහ සෙසු ලිංගික විෂමාචාර අයත් වේ.

■ ලිංගික හිංසනය විශ්වවිද්‍යාල ද ඇතුළුව සමාජයේ සිදුවන බරපතල ගැටලුවකි. වැරදි අර්ථාන්විත හෝ ලිංගික ප්‍රකාශ, වෙනස් කොට සැලකීම, හිරිහැර කිරීම හෝ ලිංගික අතවර කිරීම විශ්වවිද්‍යාලය තුළ හෝ ඊට අනුබද්ධ ආයතනවල සිදුවීම පිළිගත නොහැකි අතර, ඒවා වහාම වාර්තා කළ යුතුය.

■ වෙනත් පුද්ගලයකු මත පැටවීමට උත්සාහ දරණ අනෙකෙකුගේ ලිංගික ආශාවන් හෝ ලිංගික හිංසන හෝ විෂමාචාර, එම පුද්ගලයා විරුද්ධ ලිංගිකයෙකු හෝ එසේ නොවුවද, එයට එරෙහිව විධිමත් පරීක්ෂණයක් පවත්වාල පවතින නීතිය යටතේ පියවර ගෙන වරදකරුට දඬුවම් දී යුක්තිය ලබා දෙනු ලැබේ.

■ සදාචාරාත්මක හෝ ආචාරධර්මීය හේතු මත හැර ලිංගික හැසිරීම්වල යෙදීමට ඇති නිදහස ප්‍රායෝගිකව සීමා කළ නොහැක.

■ ශිෂ්‍යයින්, අන් අයට ලිංගික හිංසනය හෝ විෂමාචාර සිදුවන පරිදි තම කැමැත්ත සඳහා අන් අයට බල නොකළ යුතුය.

■ වින්දිතයින්ට අන් අයගේ ගෞරවය හිමි විය යුතු අතර ඔවුන්ට අපක්ෂපාතී සේවාවක් ලබා ගත හැකි විය යුතුය.

■ පහත සඳහන් දෑ අනුගමනය කිරීම දිරි ගැන්වේ. සියලු පුද්ගලයන්ට ගරු කිරීම, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව෴ වෙනස්කම් සහ විවිධත්වය ඉවසීම, යහපත් චේතනාව සහ වගවීම.

■ විශ්වවිද්‍යාල ප්‍රජාව යනු කාන්තා පිරිමි මිශ්‍ර ප්‍රජාවකි.

■ සාදාචාරාත්මක සහ ආචාර ධර්ම හේතු මත හැර ලිංගික හැසිරීම්වල යෙදිමට ඇති නිදහස ප්‍රායෝගිකව සීමා කළ නොහැක.

■ ශිෂ්‍යයින්, අන් අයට ලිංගික හිංසනය හෝ විෂමාචාර සිදුවන පරිදි තම කැමැත්ත සඳහා අන් අයට බල නොකළ යුතුය.

■ වෙනත් පුද්ගලයකු මත පැටවීමට උත්සහා දරණ අනෙකුත් ලිංගික ආශාවන් හෝ ලිංගික හිංසන හෝ විෂමාචාර, එම පුද්ගලයා විරුද්ධ ලිංගිකයකු හෝ එසේ නොවුවද, එයට එරෙහිව විධිමත් පරික්ෂණයක් පවත්වා පවතින නීතිය යටතේ පියවර ගෙන වරදකරුට දඬුවම් දී යුක්තිය ලබා දෙනු ලැබේ.

## 4.12 සොරකම

■ භෞතික භාණ්ඩ සොරකම සහ බුද්ධිමය දේපළ වැනි අස්පර්ශීය වත්කම් සොරකම (අධ්‍යයන හෝ පර්යේෂණ කටයුතුල නව සොයා ගැනීම් සොරකම) සිවිල් නීතිය යටතේ මෙන්ම විශ්වවිද්‍යාල විනය ක්‍රියා පටිපාටි යටතේ ද දඬුවම් ලැබිය හැකි වරදකි.

■ භෞතික භාණ්ඩ සොරකම් කිරීමල පුද්ගලික භාණ්ඩ හෝ විශ්වවිද්‍යාලයෙන් ලබා දීම හෝ ණයට දී ඇති දෑ, නියම අයිතිකරුගේ හෝ භාරකරුගේ අනුදැනුමකින් තොරව ඕනෑම දේපළක් සන්තයේ තබා ගැනීම ලෙස අර්ථ දැක්වේ.

■ ප්‍රමාණවත් පරිදි මූලාශ්‍රය උපුටා දැක්වීමකින් හෝ දැනුම්දීමකින් තොරව අන් අයගේ අධ්‍යයන හා පර්යේෂණ කටයුතු සහ නව සොයා ගැනීම් සොරාගැනීම ශාස්ත්‍රීය සොරකම වේ.

:ප්‍රතිපත්ති අංක CQA/A/P/03 බලන්න*

■ එවැනි ක්‍රියා මෙන්ම වැරදි සැඟවීමට දරණ ඕනෑම උත්සාහයක් පවත්නා නීති හා රෙගුලාසිවලට අනුව විනය ක්‍රියාමාර්ග ගැනීමට හේතු වේ.

## 4.13 හිතාමතා හෝ ද්වේශ සහගතව දේපළ විනාශ කිරිම

■ විශ්වවිද්‍යාලයේ දේපළ හිතාමතා හෝ ද්වේශසහගතව විනාශ කිරීම හෝ වෙනත් අය ඒ සඳහා පොළඹවා ගැනීමට එරෙහිව, පොදු දේපළ හා පෞද්ගලික වත්කම් පිළිබඳ ඉඩම් නීතියට යටතේ සහ විශ්වවිද්‍යාල රෙගුලාසි යටතේ කටයුතු කෙරේ.

■ විශ්වවිද්‍යාලයේ යටිතල පහසුකම් ගණයට ගැනෙන පන්ති කාමරවල ගෘහභාණ්ඩ, නේවාසිකාගාර ගෘහ භාණ්ඩ෴ රසායනාගාර උපකරණ, පරිගණක හා උපාංග, සංස්කෘතික මධ්‍යස්ථානයේ උපකරණ, විනෝදාත්මක උපකරණ, හෝ වෙනයම් උපකරණයක් විනාශ කිරිමට වගකිවයුතු විද්‍යාර්ථීන් හෝ කණ්ඩායම් ඒ සඳහා අලුත් වැඩියාව෴ අලාභ ගෙවීම් හෝ ප්‍රතිස්ථාපනය කළ යුතුය.

■ විශ්වවිද්‍යාල දේපළ අනාරක්ෂිත ලෙස තබායන (විනාශ කිරිමට හැකි පරිදි) විද්‍යාර්ථීන් ඒ සඳහා අලාභ ගෙවිය යුතුය.

■ දේපළ හානියට හේතුවන සිසුන්ගේ උද්ඝෝෂණ හෝ සමාජයීය ක්‍රියාකාරකම්වල සංවිධාකයින් එකී අලාභ ගෙවිය යුතුය.

■ විශ්වවිද්‍යාල දේපළවලට සිදුවන හානිය සම්බන්ධයෙන් වරදකරුවන් වගකිව යුතු බවත්, වගකිව යුත්තන්ගෙන් වන්දි ගෙවීමේ ක්‍රමවේදයක් අනුගමනය කරන ලෙසත්, එකී අලාභ ශිෂ්‍ය සමාගම් හා සභා වෙත ලබා දීමට ඇති ප්‍රතිපාදනවලින් අය කරනු සඳහාත් 2008 දෙසැම්බර් 1 වන දින අංක 902 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන චක්‍රලේඛය මඟින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපදෙස් ලබා දී ඇත.

## 4.15 බලධාරින්ට සහ පර්යේෂණ කමිටුවලට සහාය දීම

■ විශ්වවිද්‍යාලය විසින් විනය කරුණු සම්බන්ධව විවිධ කමිටු පත් කෙරෙන අතර ඒවායේ බලයලත් නිලධාරීන් විසින් වාචික හා ලිඛිත සාක්ෂ්‍ය සඳහා සිසුන්ට පැමිණෙන ලෙස කියා සිටිය හැකිය. එවැනි අවස්ථාවලදී විද්‍යාර්ථීන් එවන් බලධාරීන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම අවශ්‍ය වේ.

■ එසේ බලධාරින්ගේ කටයුතුවලට විරුද්ධවෙමින් මුරණ්ඩු ප්‍රතිපත්ත සහිතව සහය දීමට අපොහොසත් වුවහොත්ල එය විශ්වවිද්‍යාල අධිකාරිය නොසලකා හැරීමේ ක්‍රියාවක් ලෙස සැලකෙන අතර, තවත් විනය ක්‍රියාමාර්ග යකට හේතු වේ.

■ තොරතුරු ලබා ගැනීම සඳහා බලධාරින් ඉල්ලා සිටියහොත් එයට සහය දීම සඳහා සිසුන්ට දැඩි ලෙස අවවාද කෙරේ.

## 4.16 අභියාචනා අයිතිය

■ ශ්‍රේෂ්ඨාධිකරණය දක්වා අභියාචනා කිරීමේ අයිතිය මූලික අයිතිවාසිකම් යටතේ සැලකේ.

■ මෙම ප්‍රතිපත්තිය විශ්වවිද්‍යාලයට ද අදාළ වන අතර, කවර හෝ කාරණයක් සම්බන්ධව, විනය බලධරයන් විසින් දුන් තීන්දුවකට එරෙහිව, කෙනෙකුට උපකුලපතිට අභියාචනා කළ හැකිය.

■ මෙය තනිව හෝ සාමුහිකව කළ හැකි අතර, උපකුලපති හෝ නියෝජ්‍ය උපකුලපති විසින් නිසි ක්‍රමවේද ඔස්සේ එය සාධාරණ ඇහුම්කන් දීමකට ලක් කෙරේ.

# පස්වන කොටස

## විශ්වවිද්‍යාලයේ සහ විද්‍යාර්ථීන්ගේ අපේක්ෂා සහ වගකීම්

# 5

කැලණිය විශ්වවිද්‍යාලය, වෙනත් ඕනෑම රාජ්‍ය විශ්වවිද්‍යාලයකම මෙන් සිසුන් සහ කාර්ය මණ්ඩලයෙන් සමන්විත පුද්ගල ප්‍රජාවකි. ඉගැන්වීමේ, ඉගෙනීමේ, ප්‍රජාවට සේවය කිරීමේ සහ පර්යේෂණ කිරීමේ මූලික කාර්යභාරය පවත්වා ගෙන යාමට සහ වැඩි දියුණු කිරීමට විශ්වවිද්‍යාලයට ඇති හැකියාව තීරණය කිරීමට උපකාරී වන අයිතිවාසිකම් සහ වගකීම් ඔවුන් සතු වේ.

ශිෂ්‍ය ප්‍රඥප්තිය කැලණිය විශ්වවිද්‍යාලය සිය සිසුන් කෙරෙහි දක්වන කැපවීම විස්තර කරන අතර විශ්වවිද්‍යාලයෙන් සිසුන් අපේක්ෂා කරන්නේ කුමක්ද යන්න ද සඳහන් කරයි. ආයතනික නීති රීතිවලට අනුකූලව කටයුතු කිරීමට ඔවුන්ගෙන් අපේක්ෂා කෙරෙන අතර , ප්‍රජා දැනුමැති සෙසු පුරවැසියන්ට ආදර්ශයක් ලෙස ක්‍රියා කළ හැකි සහ සුදුසු සමාජ පරිවර්තනයක් ගෙන ඒම සඳහා නියෝජිතයන් ලෙස ක්‍රියා කළ හැකි ආදර්ශ පුරවැසියන් ලෙස හැඩගැස්වීමට අපේක්ෂා කෙරේ.  පෙර සඳහන් කළ මෙම සිද්ධි දාමය ප්‍රතිපලදායි වීමට ඉගෙනීමේ හා සොයාගැනීමේ දක්ෂතා දක්වන සිසුන්ට ත්‍යාග ලබා දේ. විවෘතභාවය සහ නව්‍යකරණ දිරිමත් කරනු ලැබේ අභ්‍යන්තර හා බාහිර ප්‍රජාව සමග පුළුල් ලෙස සම්බන්ධ වීම ප්‍රවර්ධනය කෙරේවිශ්වවිද්‍යාලය විසින් සපයනු ලබන සැලකිය යුතු සම්පත් හා ප්‍රතිලාභ වලින් ප්‍රයෝජන ගැනීමටත්, කැපවීම සහිත ශිෂ්‍ය ප්‍රජාවක කොටසක් ලෙස දායක වීමටත්, විශ්වවිද්‍යාලය විසින් සපයනු ලබන බොහෝ සමාජ හා ක්‍රීඩා කටයුතුවලට ක්‍රියාකාරීව සහභාගී වීමටත්, ඔවුන් තෝරා ගත් ක්ෂේත්‍රවල ආදි ශිෂ්‍ය නායකයන් වීමටත් විශ්වවිද්‍යාලය සියලු සිසුන් දිරිමත් කරයි. විශ්වවිද්‍යාල ප්‍රජාවේ සාමාජිකයෙකු ලෙස, ආරක්ෂිත සාමකාමී වාතාවරණයක් නිර්මාණය කිරීම හා පවත්වාගෙන යාම සඳහා විශ්වවිද්‍යාලයේ සාරධර්ම හා මාර්ගෝපදේශක මූලධර්මවලට අනුකූලව හැසිරීමේ වගකීම පිළිගැනීම සිසුන්ගෙන්  විශ්වවිද්‍යාලය ද අපේක්ෂා කරයි.

පහත දැක්වෙන්නේ විශ්වවිද්‍යාලයේ සහ සිසුන්ගේ අපේක්ෂා සහ වගකීම් ය.

# වගුව 1 ගරු කිරීම හා මැදිහත් වීම

| | සිසුන්ගේ අපේක්ෂාව (විශ්වවිද්‍යාලයේ වගකීම්) | විශ්වවිද්‍යාලයේ අපේක්ෂාව (සිසුන්ගේ වගකීම්) |
|---|---|---|
| 1.1<br>ගරු කිරීම | ■ ආචාරශීලීව හා ගෞරවයෙන් සැලකිය යුතු වීම.<br>■ නිදහසේ සන්නිවේදනය කිරීම සහ තාර්කික විවාදයේදී විකල්ප අදහස් ප්‍රකාශ කිරීමට හැකිවීම.<br>■ ගැටළු සහ පැමිණිලි යුහුසුළුව විසඳන ඉගෙනුම් පරිසරයක් සැපයීම.<br>■ හිරිහැර කිරීම්, වෙනස් කොට සැලකීම් සහ පීඩා කිරීම්වලින් තොර පරිසරයක් පවත්වා ගැනීම සහ හිරිහැර කිරීම් හෝ වෙනස් කොට සැලකීම් විමර්ශනය කිරීමට සහ විසඳීමට විශ්වවිද්‍යාලය පහසුකම් සැපයීම.<br>■ වෘත්තීයමය වශයෙන් සහ පෞද්ගලිකව ශිෂ්‍යයෙකු වශයෙන් සහ පසුව විශ්වවිද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙකු ලෙස සමාජයට කරන දායකත්වය අගය කිරීම. | ■ විශ්වවිද්‍යාල ප්‍රජාවේ සෙසු සාමාජිකයින්ට සියලු අන්තර්ක්‍රියා වලදී ගෞරවයෙන් හා ආචාරශීලීව සැලකීම.<br>■ අන්‍ය මතවලට ගරු කිරීම සහ එකඟ නොවීම් තර්කානුගත විවාදයට ලක් කිරීම.<br>■ නිෂ්ඵල හෝ පීඩාකාරී පැමිණිලි හෝ දුක්ගැනවිලි වලට සම්බන්ධ නොවීම.<br>■ වෙනත් සිසුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ ඉගැන්වීම්, ඉගෙනුම් හෝ පර්යේෂණ කටයුතුවලට බාධා කරන හෝ ඔවුන්ගේ රාජකාරි ඉටු කිරීමට බාධා කරන අයුරින් හැසිරීමෙන් වැළකීම.<br>■ සමාජයට, රටට සහ ලෝකයට ධනාත්මක දායකත්වයක් ලබා දීම මගින් විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙකු ලෙස ප්‍රතිලාභ හා අවස්ථා ලබා දීමේදී රට විසින් කරන ලද දායකත්වය පිළිගැනීම හා ගරු කිරීම. |
| 1.2<br>පෞද්ගලිකත්වය | ■ පෞද්ගලික සංවේදී තොරතුරු ඉල්ලා සිටින්නේ විශ්වවිද්‍යාල අධ්‍යයන හෝ පරිපාලන කටයුතු සඳහා අවශ්‍ය අවස්ථාවන්හිදී පමණක් වන අතර, එකතු කළ පසු එය නුසුදුසු හෝ අනවසර පරිශීලනයෙන් ආරක්ෂා වන ලෙස පෞද්ගලික රහස්‍යභාවයට ගරු කිරීම.<br>■ රටේ නීති සහ අදාළ විශ්වවිද්‍යාල ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටිවලට යටත්ව විශ්වවිද්‍යාලය පවත්වාගෙන යන සිසුන්ගේ පුද්ගලික වාර්තාවලට ඉල්ලීම මත ප්‍රවේශය ලබා දීම. | ■ විශ්වවිද්‍යාල ප්‍රජාවේ සියලුම සාමාජිකයන්ගේ පෞද්ගලිකත්වයට ගරු කිරීම.<br>■ ඔබගේ Kelani Net පරිශීලක මුරපදය අන් අය සමඟ බෙදා නොගන්න. තොරතුරු තාක්ෂණ පහසුකම් ඉගෙනුම් අරමුණු සඳහා පමණක් භාවිතා කළ යුතු අතර ව්‍යාපාර හෝ වෙනත් ක්‍රියාකාරකම්වල නිරත නොවිය යුතුය. |
| 1.3<br>සමානාත්මතාව සහ විවිධත්වය | ■ ස්ත්‍රී පුරුෂ භාවය, ආගම, ජනවාර්ගිකත්වය, වයස, ලිංගිකත්වය, ආබාධිතභාවය හෝ අධ්‍යයන ක්‍රමය වැනි පුද්ගල වෙනස්කම් නොසලකා සියලු සිසුන්ගේ අවශ්‍යතා සාධාරණව විසඳීම.<br>■ විවිධ විශ්වාස, පෞද්ගලික ලක්ෂණ සහ පසුබිම් ඇති පුද්ගලයින්ට එකට වැඩ කිරීමට හැකිවන අයුරින් කුසලතා සහ සාරධර්ම සංවර්ධනය කිරීමට සහාය වීම. | ■ ස්ත්‍රී පුරුෂ භාවය, ආගම, ජනවාර්ගික බව, වයස, ලිංගිකත්වය හෝ ආබාධිතභාවය වැනි පුද්ගල වෙනස්කම් නොසලකා විශ්වවිද්‍යාල ප්‍රජාවේ අනෙකුත් සාමාජිකයින්ට සාධාරණ හා ගෞරවනීය ලෙස සැලකීම. |

| | | |
|---|---|---|
| 1.4 ප්‍රතිපෝෂණය සහභාගීත්වය සහ නියැලීම | ■ විශ්වවිද්‍යාලයේ අදාළ ප්‍රඥප්ති හා නීති ප්‍රකාරව සුදුසු තීරණ ගැනීමේ ආයතන සඳහා ශිෂ්‍ය නියෝජනය<br>■ පාඨමාලා, වැඩසටහන් සහ ඉගැන්වීම් ඇගයීමට සහ වැඩසටහන් සැලසුම් කිරීම සහ පාඨමාලා සැලසුම් කිරීම සඳහා අදහස් ලබා දීම.<br>■ ශාස්ත්‍රීය සහ වෙනත් අවස්ථාවලදී සම කණ්ඩායම් සමග අන්තර්ක්‍රියා කළ හැකි ආකාරයේ අවස්ථා සලසා දේ. | ■ විශ්වවිද්‍යාලයේ අදාළ තීරණ ගැනීමේ අවස්ථාවලට ක්‍රියාකාරීව සහභාගී වීම.<br>■ ඉගැන්වීමේ ගුණාත්මකභාවය, පාඨමාලා සහ වැඩසටහන් පිළිබඳ සාධාරණ හා අවංක ප්‍රතිපෝෂණ ලබා දීම.<br>■ රැස් කරන ලද දත්ත සිසුන් ලද අත්දැකීම්වල ගුණාත්මකභාවය පිළිබඳ විශ්වවිද්‍යාලයට හඟවන බැවින් විවිධ ශිෂ්‍ය සමීක්ෂණවලට සහභාගී වීම. |

## වගුව 2 ඉගෙනීම සහ ඉගැන්වීම

| | සිසුන්ගේ අපේක්ෂාව (විශ්වවිද්‍යාලයේ වගකීම්) | විශ්වවිද්‍යාලයේ අපේක්ෂාව (සිසුන්ගේ වගකීම්) |
|---|---|---|
| 2.1 අධ්‍යයනය සහ ඇගයීම් | ■ අධ්‍යයන පිළිබඳ නිවැරදි, කාලෝචිත, ප්‍රයෝජනවත් තොරතුරු සැපයීම සහ බඳවා ගැනීම් සහ අදාළ පරිපාලන ක්‍රියා පටිපාටිවලට අදාළ තොරතුරු සැපයීම.<br>■ අවශ්‍ය අවස්ථාවන්හිදී අධ්‍යයන කාර්යයට සහාය වීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ඉංග්‍රීසි වැනි ක්ෂේත්‍රවල දැනුම හා කුසලතා ලබා දීම. | ■ බඳවා ගැනීම් හා අධ්‍යයනවලට අදාළ විශ්වවිද්‍යාල ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි පිළිබඳව දැනුම්වත් වීම සහ විශ්ව විද්‍යාලයේ ප්‍රඥප්ති, රීති සහ ප්‍රතිපත්තිවලට අනුකූල වීම.<br>■ සමාජ, ශාස්ත්‍රීය හා වෘත්තීය සාක්ෂරතාව සහ සන්නිවේදන කුසලතා සක්‍රියව සංවර්ධනය කිරීම.<br>■ ශිෂ්‍ය අධ්‍යයන සහ උපකාරක සේවා පරිශීලනය කිරීම මගින් අධ්‍යයන කුසලතා වැඩි දියුණු කිරීම සහ සුදුසු අවස්ථාවලදී උපදෙස් ලබා ගැනීම. |
| 2.2 ශාස්ත්‍රීය අවංකබව | ■ සිසුන් විසින් රචනා කරනු ලබන ඕනෑම රචනයක්, පැවරුමක් හෝ නිබන්ධනයක ප්‍රකාශන අයිතිය හඳුනා ගැනීම.<br>■ විද්වත් ප්‍රකාශන, අධ්‍යයන ප්‍රස්තුතීකරණ ආදී මුල් අධ්‍යයන සම්බන්ධයෙන් සිසුන්ගේ සදාචාරාත්මක අයිතිවාසිකම් පිළිගැනීම. | ■ ශාස්ත්‍රීය අවංකබව පවත්වාගෙන යාම සහ පරීක්ෂණවලදී හෝ වෙනත් ඇගයීම්වලදී වංචා නොකිරීම.<br>■ ශාස්ත්‍ර චෞරත්වයෙන් වැළකී සිටීම සහ නිවැරදි දත්ත මත පදනම්ව සිසුන්ගේ පර්යේෂණවල සොයාගැනීම් අර්ථ නිරූපණය කොට නිසි පරිදි ඉදිරිපත් කිරීම.<br>■ අනිවාර්ය ශාස්ත්‍රීය අවංකබව (මාර්ගගත මොඩියුලය) නිබන්ධනය සම්පූර්ණ කිරීම. |

| | | |
|---|---|---|
| 2.3<br>ශාස්ත්‍රීය අවංකබව | ■ එක් එක් අධ්‍යයන වාරයේ ආරම්භයේ දී යාවත්කාලීන කරන ලද සම්පූර්ණ අධ්‍යයන තොරතුරු සැපයීම.<br>■ වැඩසටහන් සහ පාඨමාලා අන්තර්ගතය යාවත්කාලීන කිරීම.<br>■ දේශන වේලාව හැර , පෞද්ගලිකව හෝ වෙනත් ආකාරයකින් (මාර්ගගත හෝ විද්‍යුත් තැපැල වැනි) පුද්ගල උපදේශනය සඳහා ඉගැන්වීමේ කාර්ය මණ්ඩලය සමග සම්බන්ධ වීම.<br>■ ඇගයීම් කටයුතු සාධාරණ, වලංගු සහ විශ්වාසදායක බව සහතික කිරීම.<br>■ ඇගයීම් පැහැදිලි විය යුතු අතර නියම කරන ලද කාර්ය, අධ්‍යයන අරමුණු, ඇගයීම් නිර්ණායක සහ ප්‍රදානය කරන ලකුණු අතර තාර්කික සබඳතාවක් තිබිය යුතුය.<br>■ ඉගෙනීමේ ගුණාත්මකභාවය පිළිබඳ ඇගයීම් සිදු කරනු ලබන්නේ පැහැදිලි හෝ කලින් තීරණය කරන ලද නිර්ණායක හා ප්‍රමිතීන්ට අනුව මිස වෙනත් සිසුන්ගේ සාධනය මත නොවන බව සහතික කිරීම.<br>■ ඇගයීම් සඳහා ප්‍රතිපෝෂණ සැපයීම අධ්‍යයන ක්‍රියාවලියේ වටිනා කොටසක් ලෙස පිළිගැනීම සහ ඇගයීම් නියමිත ලෙස ලකුණු කොට ප්‍රතිපෝෂණය සහිතව ලකුණු ලබා දීම.<br>■ විභාග අවසානයේදී සුදුසු ප්‍රතිපෝෂණ සමඟ සාධාරණ කාල සීමාවක් තුළ (මාසයක්) ප්‍රතිඵල නිකුත් කිරීම.<br>■ ඔබේ ඉගෙනුම් අත්දැකීම් වැඩි දියුණු කිරීම සඳහා ප්‍රවීණයන් / සම්පත්දායකයන් සමඟ සම්බන්ධ වීමට අවස්ථා ලබා දීම. | ■ දේශනවලට සහභාගී වීම, අදාළ පාඨමාලාවල ස්ථාවර ප්‍රගතියක් පවත්වා ගැනීම සහ නියමිත වේලාවට අවශ්‍ය දෑ භාර දීම.<br>■ විශ්වවිද්‍යාල පරිශ්‍රයේ සියළුම ක්‍රියාකාරකම් සහ ඔබේ අධ්‍යයන හා පර්යේෂණවලට සෘජුවම සම්බන්ධ සියලු බාහිර ක්‍රියාකාරකම් වල යෙදෙන අතරතුර මනා ලෙස හැසිරීම.<br>■ කාර්මික ස්ථානගත කිරීම් හෝ වෙනත් සායනික කටයුතු සිදු කරන අතරතුර වෘත්තීයමය වශයෙන් හැසිරෙන්න. පුහුණුවීම් පදනම් කරගත් අත්දැකීම් සහ පුහුණු හෝ ප්‍රායෝගික ඉගෙනුම් ක්‍රියාකාරකම්වල කොටසක් ලෙස ඔබට ලබා දී ඇති රෝගියාගේ, සේවාදායකයාගේ හෝ වාණිජ තොරතුරු වල රහස්‍යභාවයට ගරු කිරීම.<br>■ ඇගයීම්වලට අදාළ ප්‍රතිපෝෂණ ඉගෙනුමට යොදා ගැනීම.<br>■ ඇගයීම් සඳහා ලබා දී ඇති නිර්ණායක පිළිබඳව දැනුවත් වීම.<br>■ අධ්‍යයන කටයුතුවලට බලපාන ඕනෑම දෙයක් හැකි ඉක්මනින් කථිකාචාර්ය / අධ්‍යයන උපදේශක / අදාළ කාර්යාලයට දැන්වීම. |
| 2.4<br>පශ්චාත් උපාධි පර්යේෂණ සිසුන් | ■ උපාධි පර්යේෂණ සඳහා මාර්ගෝපදේශ සැපයීම. | ■ පර්යේෂණ උපාධි සඳහා වන මාර්ගෝපදේශවල දක්වා ඇති මාර්ගෝපදේශ පිළිබඳව දැනුවත් වීම. |

# වගුව 3 විශ්වවිද්‍යාල සම්පත් හා පහසුකම්

| | ශිෂ්‍යයාට බලාපොරොත්තු විය හැකි දෑ | ශිෂ්‍යයාගෙන් විශ්වවිද්‍යාලය බලාපොරොත්තු වන දෑ |
|---|---|---|
| **3.1** පරිසරය හා සම්පත් | ■ සිසුන්ට ඉගෙනීමට හැකිවන පරිදි සම්පත්, පහසුකම් සහ වෙනත් ආධාර ලබා දීම.<br>■ භාවිත කරන පහසුකම් සහ / හෝ උපකරණ ආරක්ෂිත බව සහතික කිරීම සහ විශ්වවිද්‍යාලයේ ව්‍යාවෘතික ස්වස්ථතාවට සහ ආරක්ෂක මාර්ගෝපදේශයන්ට අනුකූල වීම.<br>■ විශ්වවිද්‍යාලයේ සියලුම ක්‍රියාකාරකම් සඳහා තිරසාර බව සහතික කිරීම. | ■ ඉගැන්වීම සහ ඉගෙනීම සඳහා විශ්වවිද්‍යාලය සපයන පුස්තකාල, පරිගණක හා රසායනාගාර සම්පත් වැනි විශ්වවිද්‍යාල දේපල හා පහසුකම් වලට ගරු කිරීම.<br>■ විශ්වවිද්‍යාල දේපල හා පහසුකම් පිළිබඳ කිසියම් අඩුපාඩුවක් හෝ ගැටළුවක් ඇත්නම් අදාළ ස්ථානයට හැකි ඉක්මනින් වාර්තා කිරීම.<br>■ සෑම විටම විශ්වවිද්‍යාලයේ ව්‍යාවෘතික ස්වස්ථතාවට සහ ආරක්ෂක අවශ්‍යතා වලට අනුකූල වීම.<br>■ සම්පත් තිරසාර ලෙස භාවිත කිරීම. |
| **3.2** උපකාරක සේවා | ■ සෞඛ්‍ය සහ උපදේශන සේවා, ඉගෙනුම් ආධාර, වෘත්තීය මාර්ගෝපදේශනය, ආබාධිත උපකාරක සේවා, නේවාසිකාගාර තොරතුරු සහ විනෝදාත්මක පහසුකම් ඇතුළු උපකාරක සේවා සඳහා ප්‍රවේශය ලබා දීම. | ■ ඔබට සහාය අවශ්‍ය වූ විට හැකි ඉක්මනින් උපකාරක සේවාවන්ගෙන් සහාය සහ තොරතුරු ලබා ගැනීම. |

# 6 අර්ථ දැක්වීම්

මෙම ශිෂ්‍ය ප්‍රඥප්තියේ :

විශ්වවිද්‍යාලය යනු කැලණිය විශ්වවිද්‍යාලය යි.

ශිෂ්‍යයා යනු කැලණිය විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි ඕනෑම ශිෂ්‍යයෙකි.

සේවකයා යනු පූර්ණ කාලීන, අර්ධ-කාලීන හෝ ගිවිසුම්ගත කාර්ය මණ්ඩලය ඇතුළුව කැලණිය විශ්වවිද්‍යාලයේ සියලුම කාර්ය මණ්ඩලය (අධ්‍යයන හා අනධ්‍යයන)යි.